# සවිබල ගැන්වීමේ මෙවලම් කට්ටලය
# ශ්‍රී ලංකාවේ නෛතික අයිතිවාසිකම් හා ආරක්ෂාවන් අවබෝධකර ගැනීම

**Emerge Centre for Reintegration**

**හි පදිංචිකරුවන් සඳහා සම්පාදනයකර ඇත**



**කර්තෘ මණ්ඩලය:** ශෙවින්ද්‍රි මැනුවල්, වැඩසටහන් කලමනාකාර - ශ්‍රී ලංකාව, iProbono,
අශ්විනා සින්නතම්බි, වැඩසටහන් නිලධාරී, ශ්‍රී ලංකාව iProbono

**සංස්කාරක මණ්ඩලය:** ටරාන් ඛාන්, සන්නිවේදන කටයුතු ප්‍රධානී, iProbono
රධිකා සක්සේනා, ජ්‍යෙෂ්ඨ වැඩසටහන් කලමනාකාර - දකුණු ආසියාව, iProbono

**කවර සැකසුම්:** රිචා ඔබෙරෝයි, සන්නිවේදන හා අධිවාචන කලමනාකාර, iProbono

**අනුග්‍රහය:** ඉමර්ජ් ලංකා පදනම (Emerge Lanka Foundation)

අපගේ වැඩ පිළිබඳ වැඩි විස්තර සඳහා www.i-probono.com

වෙත පිවිසෙන්න

විමසීමක් සඳහා, කරුණාකර සම්බන්ධ වන්න:

**communications@i-probono.com**

---

මෙම මෙවලම් කට්ටලය නිර්මාණයකර තිබෙන්නේ පොදු තොරතුරු ලබා ගැනීම සඳහා පමණි. මෙම මෙවලම් ගොනුව, ප්‍රයෝගික භාවිතාවන් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම ඉලක්කකරන අතර, වෘත්තීමය නීති උපදෙස් ලබා ගැනීම සඳහා නිර්මාණයකර නොමැත. අවශ්‍ය නම්, නොමිලේ නීති සහාය ලබා දෙන නීති විශේෂඥයන් සමඟ ඔබ සම්බන්ධ කරවීමට අයිප්‍රෝබෝනෝ සංවිධානයට හැකි ය. මෙම මෙවලම් ගොනුව, වාණිජ අවශ්‍යතාවයන් සඳහා නැවත බෙදාහැරීම සිදුනොකළ යුතු ය.

දැඩි කම්පනයන්ට මුහුණ දී දිවිගලවා ගත් තරුණ කාන්තාවන් මෙන්ම එවන් අත්දැකීම්වලින් අනතුරුව සමාජය සමඟ යළි ඒකාබද්ධවන අයට පහසුවෙන් කියවිය හැකි පරිදි මෙම මෙවලම් ගොනුව නිර්මාණයකර තිබේ.

මෙම මෙවලම් ගොනුව, 2025 ජනවාරි තෙක් ලබාගත හැකි තොරතුරුවලට අනුකූලව නිර්මාණයකර ඇත. මෙහි ඇතුළත් තොරතුරු අදාළ බලධාරීන්ගේ සංශෝධනයන්ට ලක්විය හැකි ය.

# හැඳින්වීම

මෙම මෙවලම් කට්ටලය, ශ්‍රී ලංකාව තුළ අපයෝජනයන්ට මුහුණ දී නැවත තම ජීවිතය ගොඩනගා ගෙන ජීවිතය ජයගැනීමට වෙරදරන පුද්ගලයන් සඳහා නිර්මාණයකරන ලද පරිපූර්ණ මාර්ගෝපදේශයකි. අපගේ නීතිඥවරුන්, ක්‍රියාකාරීන්, හා මානසික සෞඛ්‍ය විශේෂඥයන් විසින් නිර්මාණයකරන ලද මෙම මෙවලම් ගොනුවෙන්, ඔබට ඔබගේ ජීවන ගමනේ නිවැරදි දිශාව සොයාගැනීම සඳහා අවශ්‍ය ප්‍රයෝගික උපදෙස් හා නීතිමය තොරතුරු ලබා දේ.

කම්පනයෙන් මිදී ජීවිතය යළි ගොඩනගා ගැනීම පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්විය හැකි ගැඹුරු අත්දැකීමකි. එබැවින්, විවිධාකාරයේ අවශ්‍යතා හා තත්ත්වයන් ආවරණයවන පරිදි මෙම සම්පත් ගොනුව නිර්මාණයකර ඇත. ජීවිතය යළි ගොඩනගා ගැනීම සඳහා පුද්ගලයකු තුළ ආරක්ෂාකාරී හැඟීමක් ඇතිකිරීම අත්‍යාවශ්‍ය කරුණකි. පුද්ගලයකුට තමා පිළිබඳ ආත්ම විශ්වාසය යළි ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය මූලික අඩිතාලම සැපයීමට මෙම ආරක්ෂාකාරී හැඟීම අත්‍යාවශ්‍ය ය. ඔබ ඔබගේ ජීවිතය යළි ගොඩනගා ගැනීම ආරම්භ කළා පමණයි ද? නැතිනම් ජීවිතය යළි ගොඩනගා ගැනීම කලක පටන්ම සිදුකරමින් සිටී ද? එසේ නම්, මෙම මෙවලම් ගොනුව ඒ සඳහා අවශ්‍ය සුබවාදී උත්තේජනයක් ලබා ගැනීමට මෙන්ම ඔබගේ අනාගතය වඩාත් ස්ථාවර හා පරිපූර්ණකර ගැනීමට උපකාරවනු ඇත.

මෙම මෙවලම් ගොනුව, ඔබට සොයාගත හැකි තවත් බොහෝ සම්පත් අතර එක් සම්පත් ගොනුවක් පමණි. වැඩිදුර උපකාර සඳහා මෙහි ලැයිස්තුගතකර ඇති වෘත්තිකයන් හා සහායක ජාල වෙත යොමුවිය හැකි ය. ඔබ මෙම මෙවලම් ගොනුව කියවන අතරතුර, එහි ඇතුළත් තොරතුරු අවබෝධකර ගැනීමට හා ඔබට වඩාත් ගැළපෙන උපදෙස් මොනවා ද යන්න හඳුනා ගැනීමට ඇතිතරම් කාලය ගන්න.

ජීවිතය යළි ගොඩනගා ගැනීම සරල ක්‍රියාවලියක් නොවේ. එබැවින් ඒ සඳහා ඔබට අවශ්‍ය තරම් කාලය ගත්තාට වරදක් නැත. මතක තබා ගන්න, ජීවිතය යළි ගොඩනගා ගැනීම සඳහා ඔබ ගන්නා සෑම පියවරක්ම ජයග්‍රහණයකි. ඔබගේ ඔරොත්තු දීමේ හැකියාව, සහ අපේක්ෂාවන් හා අවස්ථාවන්ගෙන් පිරුණු නව පරිච්ඡේදයක් බිහිකර ගැනීම සඳහා ඔබට ඇති හැකියාව ගැන අපි විශ්වාසය තබන්නෙමු.



# අන්තර්ගතය

05
නීතිය පිළිබඳ හැඳින්වීම

06
අධිකරණ පද්ධතිය

07
අපයෝජනය තේරුම් ගැනීම

09
පොදු වැරදි හා ඒවා
තේරුම් ගන්නා ආකාරය

15
ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

24
සයිබර් අපරාධ

30
පොලීසිය සමඟ වැඩ කිරීම

32
ශ්‍රී ලංකා මානව හිමිකම්
කොමිෂන් සභාවේ
පැමිණිල්ලක් ගොනු කිරීම

33
ඔබගේ අයිතීන් ගැන දැනුවත්
වෙන්න: වින්දිතයන් හා
සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

34
අධිකරණයට යාම

35
සේවාවන්

# නීතිය පිළිබඳ හැඳින්වීම

| | |
|---|---|
| **නීතිය යනු කුමක්ද?** | නීතිය යනු සමාජය ආරක්ෂිත ව, සාධාරණ ව, සහ සාමයෙන් පවත්වාගෙන යාම සඳහා බලධාරීන් විසින් සම්පාදනය කරන ලද නියමයන් සමුදායකි. මෙම නියමයන් මිනිසුන් හැසිරිය යුතු ආකාරය පිළිබඳ මඟපෙන්වන අතර, එකී නියමයන් කඩකළ විට අත්වන ඉරණම පිළිබඳව මෙම නියමයන්වල දැක්වේ. |
| **අපට නීති පවතින්නේ ඇයි?** | නීති අපගේ අයිතීන්, දේපල, හා යහපැවැත්ම ආරක්ෂා කරනු ලබයි. ගැටුම් විසඳීම, සාධාරණත්වය තහවුරු කිරීම, සහ යුක්තිය පසිඳලීම සඳහා නීතිය උපකාර කරනු ලබයි. එමෙන්ම, හානිකර ක්‍රියාකාරකම්වලට එරෙහි ප්‍රතිවිපාක ගෙන ඒමට ද නීතිය කටයුතු කරයි. |
| **නීති සම්පාදනය කරන්නේ කවුරුන් ද?** | නීති සම්පාදනය කරනු ලබන්නේ පාර්ලිමේන්තුව වැනි ජනවරමින් තේරී පත් වූ ආයතනවලින්වන අතර, නීතීන් විග්‍රහ කරනු ලබන්නේ හා භාවිතා කරනු ලබන්නේ අධිකරණ විසිනි. |
| **නීතිය කඩකළ විට සිදුවන්නේ කුමක්ද?** | නීතිය කඩකිරීම තුළින් අවවාද ලබාදීම, දඩ නියම කිරීම, හෝ සිරදඬුවම් පැමිණවීම වැනි නීතිමය ප්‍රතිවිපාකවලට මුලපිරිය හැකි ය. වරදේ බරපතලභාවය මත දඬුවමේ ස්වභාවය වෙනස්විය හැකි ය. |
| **නීතිය යටතේ ඔබට හිමි අයිතීන්** | සෑම පුද්ගලයකුට ම, නීතිය ඉදිරියේ සමානාත්මතාවය, වධහිංසාවලින් නිදහස් ව සිටීම, භාෂණයේ නිදහස, සිරුර සහ දේපල සඳහා ආරක්ෂාව, අපරාධයක් වාර්තා කිරීමට ඇති අයිතිය සහ උපකාර පැතීම වැනි මූලික අයිතිවාසිකම් ඇත. |
| **ඔබ වෙනුවෙන් නීති පද්ධතිය ක්‍රියාකරන ආකාරය** | නීතිය ක්‍රියාත්මක කර මහජනතාව ආරක්ෂා කිරීමට පොලීසිය උපකාර කරයි.<br>සාධාරණ තීන්දු ලබා දීම මඟින් යුක්තිය ඉටුවන බවට විනිසුරුවරු තහවුරු කරති.<br>ඔබගේ අයිතීන් අවබෝධකර ගැනීමට සහ නීතිමය කටයුතුවල දී ඔබ නියෝජනය කිරීමට නීතිඥවරු උපකාර කරති. |
| **ඔබ නීතිය දැන සිටිය යුත්තේ ඇයි?** | නීතිය අවබෝධකර ගැනීමෙන් තමා ආරක්ෂාකර ගැනීමට, තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට, සහ වඩාත් ආරක්ෂිත, සාධාරණ ප්‍රජාවක් ගොඩනැගීමට ඔබව සවිබල ගන්වනු ඇත. |

# අධිකරණ පද්ධතිය

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ව්‍යුහය විවිධ ස්ථරයන්ගෙන් සමන්විතවන අතර, එකී සෑම ස්ථරයක් කෙරේ ම පැවරුණු සුවිශේෂී භූමිකාවන් හා වගකීම් පවතී. ඒ ඒ අධිකරණවල අධිකරණබලය අවබෝධකර ගැනීමෙන්, යුක්තිය පතා යා යුත්තේ කොතැනට ද, සහ ඒ ඒ අධිකරණ වගකියනු ලබන්නේ කුමන ආකාරයේ කරුණු සඳහා ද යන්න හඳුනා ගැනීමට අපට හැකි වේ. මෙම දැනුම මගින් නීති පද්ධතිය වඩාත් විශ්වාසයෙන් යුතුව භාවිතා කිරීමට සහ තමාට අවශ්‍ය සහාය ලබා ගැනීමට ජනතාව සවිබලගැන්වේ.

## 1 ශ්‍රේෂ්ඨාධිකරණය

මෙය රටේ පවතින ඉහළම අධිකරණයයි. ව්‍යවස්ථාමය කරුණු, මූලික අයිතිවාසිකම් නඩු, පහළ අධිකරණවලින් ලැබෙන අවසාන අභියාචනා, මැතිවරණ-ආශ්‍රිත මතභේද, සහ නීති සමාලෝචනය ආදී කරුණු සම්බන්ධයෙන් මෙම අධිකරණයට බලය ඇත. පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමෙහි ලා මෙම අධිකරණය ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලබයි.

## 2 අභියාචනාධිකරණය

මෙම අධිකරණය, මහාධිකරණය හා වෙනත් පහළ අධිකරණවලින් ඉදිරිපත්වන අභියාචනා විභාග කරනු ලබයි. එමෙන්ම, රිට් අයදුම්පත් (රජයේ අධිකාරියක් විසින් ගනු ලබන තීරණයකට අභියෝග කරනු ලබන නඩු) ද මෙහෙයවනු ලබන මෙම අධිකරණය, නීතිමය සහ පරිපාලන ක්‍රියාපටිපාටි නිවැරදි ව අනුගමනය කරන බව ද සහතික කරනු ලබයි.

## 3 මහාධිකරණය

මිනීමැරුම්, බරපතල ලිංගික අපයෝජන, සහ මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි බරපතල අපරාධ වැරදි ආශ්‍රිත නඩු මෙහෙයවනු ලබයි. එමෙන්ම, මහේස්ත්‍රාත් අධිකරණ සහ ප්‍රාථමික අධිකරණවලින් ඉදිරිපත්වන අභියාචනා විභාග කිරීමට ද මෙම අධිකරණය කටයුතු කරනු ලබයි.

## 4 දිස්ත්‍රික් අධිකරණ

ඉඩම් ආරවුල්, දික්කසාද, ණය ආපසු ගෙවීම්, උරුමය පිළිබඳ කරුණු, සහ පවුල් ආරවුල් වැනි කරුණු ආශ්‍රිත නඩු විභාගයට ගැනීම මෙම අධිකරණවල දී සිදුවේ.

## 5 මහේස්ත්‍රාත් අධිකරණ

සොරකම්, පහරදීම්, මාර්ග නීති උල්ලංඝනය කිරීම් වැනි කුඩා අපරාධ වැරදි ආශ්‍රිත නඩු විභාග කිරීම මෙම අධිකරණවල දී සිදුවේ. දඩ පැනවීම, කෙටි-කාලීන සිරදඬුවම් පැනවීම, සහ පසුව මහාධිකරණයකට යොමු කිරීමට නියමිත බරපතල නඩුවක් ආශ්‍රිත මූලික විමර්ශනයන් සඳහා නියෝග නිකුත් කිරීමට මෙම අධිකරණවලට බලය ඇත. එමෙන්ම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් වෙනුවෙන් ආරක්ෂක ආඥාවක් නිකුත් කිරීමට මෙම අධිකරණවලට බලය ඇත.



# අපයෝජනය තේරුම් ගැනීම

## අපයෝජනයේ විවිධ ආකාර හඳුනා ගැනීම

### ශාරීරික අපයෝජනය

යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට හිතාමතාම ශාරීරිකව රිදවීම මෙහි දී සිදුවේ. මෙය පහරදීම, කෙනිත්තීම, පයින් ගැසීම, හෝ පිලිස්සීම වැනි ආකාර ගත හැකි ය. මෙහි දී ඇතැම්විට තැළුම් පාරවල්, කැපුම් පාරවල් හෝ අස්ථි බිඳීයාම් සිදුවිය හැකි ය.

### ලිංගික අපයෝජනය

යම් තැනැත්තකු තවත් තැනැත්තකු සමඟ එම තැනැත්තාගේ අනුමැතියකින් තොරව ලිංගික ක්‍රියාවකට යොමුවීම මෙහි දී සිදුවේ. වැඩිහිටියකු දරුවකු සමඟ ඕනෑම ආකාරයක ලිංගික ක්‍රියාවක නිරත වන්නේ නම්, එය ලිංගික අපයෝජනයකි. යම් තැනැත්තකු තවත් තැනැත්තකු අනවශ්‍ය ආකාරයෙන් ස්පර්ශ කිරීම හෝ එම තැනැත්තාගේ සිරුර හෝ රහස් ප්‍රදේශ දෙස අනවශ්‍ය ආකාරයෙන් බැලීම මීට අයත්විය හැකි ය.

### මානසික අපයෝජනය

යම් තැනැත්තකු අපහසුතාවයට හෝ පීඩාවට පත්වන ආකාරයෙන් තවත් තැනැත්තකු විසින් වේදනාකාරී හෝ පහත් ආකාරයේ ප්‍රකාශ සිදුකිරීම මෙහි දී සිදුවේ. දරුවකුට දුක හෝ බිය ඇතිවන පරිදි නින්දාසහගත වචන කීම, එම දරුවා හුදෙකලා කිරීම හෝ නොසලකා හැරීම මීට අයත්විය හැකි ය.

### නොසලකා හැරීම

දරුවකු නිසි පරිදි බලා ගැනීමට වැඩිහිටියකු කටයුතු නොකිරීම මෙහි දී සිදුවේ. දරුවාට නිසි පරිදි ආහාරපාන ලබා නොදීම, ජීවත් වීමට ස්ථානයක් ලබා නොදීම ආදිය මීට ඇතුළත් විය හැකි ය. මෙමගින් දරුවාට වේදනාවක්, තනිකමක් හෝ ආදරය නොමැති බවක් දැනී යා හැකි ය.



# අපයෝජනය පිළිබඳ මිත්‍යාමත සහ දුර්මත

**මිත්‍යාව: අසරණ වූ පවුල්වල හෝ එක්තරා පිරිසකට පමණක් අපයෝජනය සිදුවේ.**

**සත්‍යය**

අපයෝජනය ඕනෑම පවුලක සිදුවිය හැකිය. ඔවුන් කොපමණ පොහොසත් ද, දුප්පත් ද, හෝ ඔවුන් පැමිණෙන්නේ කොහේ සිට ද යන්න මීට අදාළ නොවේ.

**මිත්‍යාව: යම් අයෙකු අපයෝජනය වූවහොත්, එම තැනැත්තා ද දවසක අපයෝජකයකු වනු ඇත.**

**සත්‍යය**

රිදවීමට ලක් වූ ඇතැමුන් තවකෙකුට රිදවීමට නැඹුරු වීමට ඉඩ පැවතිය ද, බොහෝ දෙනෙක් කිසිවකුට රිදවීමකින් තොරව සතුටින් හා සාමයෙන් ජීවත් වීමට කැමති වෙති.

**මිත්‍යාව: යම් අයෙකු අපයෝජනයට ලක්ව තිබේ නම්, එම තැනැත්තාගේ සංඥා දෙස බලා එම තැනැත්තා අපයෝජනයට ලක්ව ඇති බව පහසුවෙන් කිව හැකියි.**

**සත්‍යය**

අපයෝජනය පිටින් බලා කීම අපහසු ය. විශේෂයෙන් ම මානසික අපයෝජනය හෝ නොසලකා හැරීම හඳුනාගැනීමට අපහසු ය. අවධානය යොමුකොට යම් අයකු කරදරේ වැටී සිටින්නේ ද යන වග හඟවන සංඥා හඳුනා ගැනීම වැදගත් ය.

# පොදු වැරදි හා ඒවා තේරුම් ගන්නා ආකාරය



අපයෝජනය විවිධ ආකාර ගත හැකියි. මෙමගින් සිදුවන හානි කුමන ආකාරයක් ගන්නේ ද යන්න හඳුනා ගැනීම තුළින් මෙහි පවතින බරපතලකම වටහාගෙන ගැටළු ආමන්ත්‍රණය කිරීමට පහසුවනු ඇත.

ශ්‍රී ලංකාව තුළ වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු “ළමයකු” ලෙස සලකන බැවින්, එවන් තැනැත්තකු බාලවයස්කරුවකු ලෙස සැලකේ.

# අපයෝජනයට සම්බන්ධ වැරදි

## දරුවන්ට කෲර ලෙස සැලකීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 308අ වගන්තිය

**මෙහි තේරුම:** දරුවකුගේ දෙමාපියකු හෝ භාරකාරයකු විසින් එම දරුවාට රිදවන අවස්ථාවක් මින් අදහස් කෙරේ. දරුවාට පහරදීම, දරුවා හොඳින් බලාකියා නොගැනීම, දරුවා තනිකර හැරීම, හෝ දරුවාට ජීවත්වීමට අවශ්‍ය කිසිවක් ලබා නොදීම ආදිය මීට ඇතුළත් ය. මෙය දරුවාට වේදනාකාරීවිය හැකි ය. මෙම වේදනාව, එම දරුවාගේ සිරුරට, සිතට, හෝ ඇතැම්විට එම දරුවාට ඇහෙන පෙනෙන දෑට පවා බලපෑ හැකි ය.

**උදාහරණ:** සමන්ගේ වයස අවුරුදු 10යි. ඔහුගේ මව ඔහුට ආහාරපාන වත් නොදී නිවසේ තනිකර යයි. සමහර අවස්ථාවල, ඔහු දවස් ගණන් ඇගේ රැකවරණයෙන් තොරව සිටියි. මේ නිසා ඔහු සිටින්නේ දුකෙන් සහ බියෙනි. සමන්ගේ මව මෙම අපරාධයට වැරදිකාරියක විය හැකි ය.

ෂර්ලිගේ පාසල් ගුරුවරයා ෂර්ලිට දිනපතා කෑ ගසයි. දවසක, ඔහු කෝටුවකින් ඇගේ අතට පහර දී ඈ මෝඩ බව කියයි. දැන් ෂර්ලි පාසල් යාමට බියෙන් සිටියි, ඇට අනාරක්ෂිත බවක් දැනේ. ෂර්ලි ගේ ගුරුවරයා මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## අඩත්තේට්ටම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 342 වගන්තිය

**මෙහි තේරුම:** යම් තැනැත්තකුට රිදවීමට හෝ එම තැනැත්තාට රිදවනු ඇතැයි සිත තුළ බියක් ඇතිකිරීමට තවත් තැනැත්තකු විසින් සිතාමතාම සිදුකරන දෙයක් මින් අදහස් කෙරේ. මෙම බිය ශාරීරික වේදනාව පිළිබඳව ඇතිවිය යුතු ම නැහැ; මානසික වේදනාව හෝ පීඩාව ද මීට ඇතුළත්විය හැකි ය.

යම් තැනැත්තකු විසින් කිසිවක් සිදුනොකර තවත් තැනැත්තකුට සිත් රිදවන දෙයක් පැවසීම අඩත්තේට්ටම් කිරීමක් ලෙස සැලකිය හැකි ද?

සාමාන්‍යයෙන් නැහැ. නමුත් එම ප්‍රකාශය එම තැනැත්තා විසින් සිදුකරනු ලබන තර්ජනාත්මක ක්‍රියාවක කොටසක් නම්, එය අඩත්තේට්ටම් කිරීමක් ලෙස සැලකේ.

**උදාහරණයක්:** මංජුල, ෂෙහාරාට පහරදෙන බව කෑගසමින් පවසා ඇට ගැසීමට සූදානම්වන අයුරින් තම අත මිට මොලවා කරකවයි. මෙහි දී ශාරීරිකව පහර දීමක් සිදුනොවූව ද, මංජුල තමාට පහර දෙනු ඇතැයි ෂෙහාරා බියෙන් සිටියි. මංජුල මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## ලිංගික අඩත්තේට්ටම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය

**මෙහි තේරුම:** යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකු ලිංගික වශයෙන් අපහසුතාවයට හෝ සිත් වේදනාවට පත්වන ආකාරයේ ක්‍රියාවක් සිදුනොකළ යුතු ය යන්න මෙම නීතියෙන් කියවේ. අනවශ්‍ය දෑ කීම, හෝ තමා අල්ලනවාට අකමැති තැනැත්තකු ඇල්ලීම මීට අයත්විය හැකි ය.

**උදාහරණයක්:** රූපිකා ව්‍යාපාර ක්ෂේත්‍රයේ කාර්යාලයක සේවිකාවක ලෙස වැඩකරයි. ඇගේ සේවාසගයකුවන යොහාන් ඇගේ පෙනුම පිළිබඳ නිතර අදහස් දක්වයි. මෙය ඇට කරදරයකි. මින් ඈ අපහසුතාවයට පත්වන බව හොඳටම දැකගත හැකිවූව ද, යොහාන් දිගින් දිගටම ඇගේ පෙනුම පිළිබඳ විවිධ කතා කියයි. තව ද, ඔහු ඈ සමඟ කතාකරන විට ඇගේ උරහිස අල්ලයි. යොහාන් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## දරුවන් ලිංගිකව සූරාකෑම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 360ආ වගන්තිය

**මෙහි තේරුම:** පහත දැක්වෙන ආකාරයේ සිදුවීම් මීට ඇතුළත් වේ;

- ලිංගික ක්‍රියා සඳහා දරුවකු යොදා ගැනීම හෝ ලිංගික ක්‍රියාවක පාර්ශවකරුවකු ලෙස දරුවකු යොදා ගැනීම.
- යම් තැනැත්තකු සමඟ ලිංගිකව හැසිරීමට දරුවකු යොමු කිරීම, හෝ ඔවුනට නරක දෙයක් සිදු කිරීම.
- දරුවකු සමඟ ලිංගික ක්‍රියාවක නිරත වීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා ප්‍රචාරණ දියත් කිරීම හෝ වෙනත් ක්‍රමවලින් ඔවුන් ඒ සඳහා උනන්දු කරවීම.
- දරුවකු සමඟ පවතින සම්බන්ධතාවයෙන් ප්‍රයෝජන ගෙන එම දරුවා ලවා ලිංගික ක්‍රියාවන් කරවීම.
- දරුවකු ලවා ලිංගික ක්‍රියාවන් කරවීම සඳහා ඔවුන් බියවැද්දීම හෝ ඔවුනට රිදවීම.
- දරුවකු ලවා ලිංගික ක්‍රියාවන් කරවීම සඳහා එම දරුවාට හෝ එම දරුවාගේ දෙමාපියන්ට මුදල් හෝ තෑගි ලබා දීම හෝ වෙනත් දෙයක් සිදුකිරීම.

දරුවන් ආරක්ෂා බව සහතික කිරීම සහ ඔවුනට ඉහත දැක්වෙන කිසිඳු ආකාරයකින් හානි සිදු නොවන බව තහවුරු කිරීමට මෙම නීතිය පවතියි.

උදාහරණයක්: කපිල වයස අවුරුදු 14 ක පිරිමි ළමයකු වන අතර 53 හැවිරිදි පියල්ගේ නිවසට අල්ලපු නිවසේ ජීවත් වෙයි. පියල් තම නිවසට පැමිණෙන ලෙස කපිලට ආරාධනා කරයි. කපිල පැමිණි පසු පියල් ඔහු වෙත ලිංගික හැසිරීම් දක්වයි. ඒ සඳහා පියල් කපිලට තෑගි ලෙස මුදල් හා අලුත් ජංගම දුරකතනයක් ලබා දෙයි. පියල් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## ජාවාරම් - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 360ඇ වගන්තිය

**මෙහි තේරුම:** පහත දැක්වෙන ආකාරයේ සිදුවීම් මීට ඇතුළත් වේ;

- යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම, හෝ වෙළඳාම් කිරීම, හෝ එසේ කිරීමට වෙනත් තැනැත්තකු පෙළඹවීම - මුදල් හෝ වෙනත් ප්‍රතිලාභ බලාපොරොත්තුවෙන් මෙවන් ක්‍රියාවක් සඳහා උදව් ලබා දෙන, දිරිගන්වන, හෝ එවන් දෙයක් සිදුවන ඕනෑම ක්‍රියාවක් මීට ඇතුළත් ය.
- යම් තැනැත්තකු විසින් තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, බොරු පැවසීමෙන්, හෝ රැවටීමෙන් තවත් තැනැත්තකු බඳවා ගැනීම, රැගෙන යාම, මාරුකර යැවීම, සැඟවීම, හෝ ළඟ තබා ගැනීම - මෙමඟින් ඔවුන්ගේ කැමැත්තට එරෙහිව වැඩ කරවා ගැනීම, වහල්කමේ යෙදවීම, ඔවුන්ගේ අවයව ලබා ගැනීම, ලිංගික වෘත්තියේ යෙදවීම හෝ වෙනත් ලිංගික සූරාකෑමකට ලක්කිරීම, හෝ වෙනත් ඕනෑම නීති විරෝධී ක්‍රියාවකට යොමුකරවීම සිදු වේ.
- යම් තැනැත්තකු විසින් දරුවකු එම දරුවාගේ කැමැත්ත අකමැත්ත කුමක් වුව ද බඳවා ගැනීම, රැගෙන යාම, මාරුකර යැවීම, සැඟවීම, හෝ ළඟ තබා ගැනීම - මෙහි දී එම දරුවාගේ කැමැත්තට එරෙහිව වැඩ කරවා ගැනීම, වහල්කමේ යෙදවීම, ඔවුන්ගේ අවයව ලබා ගැනීම, ලිංගික වෘත්තියේ යෙදවීම හෝ ලිංගික සූරාකෑමට ලක්කිරීම, හෝ වෙනත් ඕනෑම නීති විරෝධී ක්‍රියාවකට යොමුකරවීම සිදුවේ.

**උදාහරණයක්:** අනුලා නැමැති තැනැත්තිය 08 හැවිරිදි මාලිකාගේ මව ලෙස පෙනී සිටිමින් ඈ රෝහලෙන් රැගෙන යයි. මාලිකා දරුකමට හදාවඩා ගැනීමට අපේක්ෂා කරන ජෝශ් නැමති විදේශිකයකුට අනුලා මාලිකා ව විකුණයි. අනුලා සහ ජෝශ් මෙම අපරාධයට වරදකරුවන් විය හැකි ය.

තවත් උදාහරණයක්: තමාට කොළඹ හොඳ රැකියාවක් සොයා දිය හැකි බවත්, එමඟින් බොහෝ මුදලක් උපයා හොඳ ජීවිතයක් ගතකළ හැකි බවත් මැතිව් සාරාට පවසයි. ඊට එකඟවන සාරා ඉන්දුනීසියාවේ සිට කොළඹට පැමිණෙයි. එහෙත්, ලංකාවට පැමිණි පසු මැතිව් නැමැත්තා පැවසුවේ බොරු බව සාරාට තේරෙයි. හොඳ රැකියාවක් ලැබෙනු වෙනුවට, වැටුපක් ද නොමැතිව දුෂ්කර රැකියාවක නිරත වීමට සාරාට සිදුවෙයි. ඇට රිදවා හෝ භයානක වැඩවල නිරතවීමට බලකර ඇති අතර, මිනිසුන්ට ලිංගික අල්ලස් ලබා දීමට ද ඈ ට සිදුව ඇත. මැතිව් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## දරුවන් ලිංගික ක්‍රියාවලට යොමුකරවා ගැනීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 360ඉ වගන්තිය

මෙහි තේරුම: වැඩිහිටියකු දරුවකු ලවා ලිංගික ක්‍රියාවන් සිදුකරවීමට තැත්කිරීම මෙහි අදහසයි. මෙය ශ්‍රී ලංකාවේ තබා වෙනත් රටක සිදුවූව ද නීති විරෝධී ය.

උදාහරණයක්: 40 හැවිරිදි චාමර වයස අවුරුදු 12 ක් වූ ස්නෙහා නම් ගැහැණු ළමයා සමඟ යහළු වෙයි. ඉන් අනතුරුව තම ලිංගික අවයව අල්ලන මෙන් ඔහු ඇගෙන් ඉල්ලා සිටියි. චාමර මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

තවත් උදාහරණයක්: ඇමරිකාවේ ජීවත්වන 26 හැවිරිදි ජෝන් ෆේස්බුක් හරහා ශ්‍රී ලංකාවේ ජීවත්වන 15 හැවිරිදි සචිනි සමඟ සම්බන්ධ වෙයි. ජෝන් සචිනිට ලිංගික පණිවිඩ හා ඡායාරූප යවයි. ඉන් අනතුරුව තමාට වීඩියෝ කෝල් එකක් ගන්නා ලෙස සචිනිගෙන් ඉල්ලා සිටියි. ජෝන් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

## ලිංගික අපයෝජනය (දූෂණය) - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තිය

මෙහි තේරුම: පිරිමියකු කාන්තාවකගේ අවසරයෙන් තොරව ඈ සමඟ ලිංගික සංසර්ගයේ යෙදීම මෙහි අදහසයි. මෙම අත්දැකීමට මුහුණදෙන විට ඈ සිරකර තැබූ අවස්ථා, හෝ ඈ පියවි සිහියෙන් නොසිටි අවස්ථා, හෝ මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ශරීරගත වී සිටි අවස්ථා ද මීට ඇතුළත් ය.

උදාහරණයක් ලෙස: අමල්ට කමලා සාදයක දී හමුවෙයි. ඔහු කමලාට මත්පැන් පොවා ඈ හුදෙකලා ස්ථානයකට ගෙනවිත් දූෂණය කිරීමට සැරසෙයි. තමා සමඟ ලිංගික සංසර්ගයේ යෙදුනේ නැතහොත් ඈ මරා දමන බව අමල් කමලාට පවසයි. බියෙන් තැතිගත් කමලා අමල්ගේ ඉල්ලීමට අවනත වෙයි. අමල් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

අවසරය ලබා දිය යුත්තේ තම කැමැත්තෙන් ම බව සඳහන් කිරීම වැදගත් ය:

- බිය නිසා ලිංගික සංසර්ගයට එකඟවීම අවසරය ලබා දීමක් නොවේ
- මානසික රෝගී තත්ත්වයක් ඇති පුද්ගලයකුගෙන් අවසරය ලබා ගැනීම වලංගු නොවේ
- මත්ද්‍රව්‍ය හෝ මත්පැන් ශරීරගත වී සිටිය දී අවසරය ලබා ගැනීම වලංගු නොවේ

## ව්‍යභිචාරය - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 364අ වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු තමාට ඥාති සම්බන්ධතාවයක් ඇති තැනැත්තකු සමඟ ලිංගික සංසර්ගයේ යෙදීම මෙහි අදහසයි. තම දෙමාපියන්, සහෝදර සහෝදරියන්, හෝ දරුවන් මීට අයත්විය හැකි ය.

උදාහරණයක්: නාමල් යනු පූජාගේ පියාගේ සොයුරායි. තමා සමඟ ලිංගික සංසර්ගයේ යෙදෙන මෙන් නාමල් පූජාට බලකර සිටියි. ඈ තම ලේලි බැවින් මෙය ඇගේ රාජකාරිය බව නාමල් පවසයි. නාමල් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### බරපතල ලිංගික අපයෝජනය - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 365ආ වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු විසින් ලිංගික තෘප්තිය සඳහා තම ලිංගික අවයව, සිරුරේ වෙනත් අවයව, හෝ උපකරණ, තවත් තැනැත්තකුගේ සිරුරේ එම තැනැත්තාගේ අවසරයෙන් තොරව ස්පර්ශ කරවීම මෙහි අදහසයි. මීට දූෂණය යන ක්‍රියාවට අයත් නොවන, එහෙත් සැලකිය යුතු හානියක් සිදුකරන ඕනෑම ක්‍රියාවක් අයත්විය හැකි ය. එමඟින් ශාරීරික සහ මානසික කම්පනයක් ගෙනදිය හැකි ය.

වින්දිතයාට ශාරීරික තුවාල සහ මානසික කම්පනය ඇතිකරන ආකාරයෙන් තුරුල්කර ගැනීම, බලහත්කාරයෙන් මුඛ සංසර්ගයේ යෙදීම, හෝ උපකරණ ඇතුළු කිරීම වැනි ක්‍රියාවන් මීට ඇතුළත් විය හැකි ය.

උදාහරණයක්: 50 හැවිරිදි යොහාන් යනු මාලිනී ගේ අසල්වැසියෙකි. මාලිනී 17 වැනි වියේ පසුවෙයි. මාලිනී පාරේ ගමන්කරන විට, යොහාන් ඇ අල්ලාගෙන ඇගේ පියයුරු තුරුල් කර ගනියි. ඉන් මාලිනී ට සුළු තැළුම් ඇතිවේ. යොහාන් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### සාපරාධී බියවැද්දීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 483 වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුගේ සිරුරට රිදවන බවට, කීර්තියට හානිකරන බවට, දේපලවලට හානිකරන බවට, හෝ සමීප පුද්ගලයකුට හානිකරන බවට තර්ජනය කර එම තැනැත්තා ලවා එම තැනැත්තා අකමැති දෙයක් කරවා ගැනීම මෙහි අදහසයි.

උදාහරණයක්: දමිත් රූපා සමඟ ප්‍රේම සම්බන්ධයක සිටියේය. මාස කිහිපයකට පසු රූපා එම ප්‍රේම සම්බන්ධය අවසන් කළාය. මෙය දරා ගැනීමට නොහැකිව දමිත් දිගින් දිගටම රූපාට දුරකතනයෙන් කතා කරයි. රූපා මෙම දුරකතන ඇමතුම් ගණන් නොගනියි. ඉන් අනතුරුව, රූපා යළි තමා සමඟ ප්‍රේම සම්බන්ධය පටන් නොගත්තොත් ඇගේ නිවස ගිනි තබන බවට දමිත් රූපාගේ නිවසට පැමිණ තර්ජනය කරයි. දමිත් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### අයුතු ලෙස සිරගත කිරීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 348 වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු තවත් තැනැත්තකුට අඩත්තේට්ටම් කොට, හෝ සාපරාධී බලහත්කාරය පා එම තැනැත්තා අයුතු ලෙස සිරගත කිරීම මින් අදහස් කෙරේ.

උදාහරණයක්: 18 හැවිරිදි මරී ජගත්ගේ දියණියයි. මරී කමල් සමඟ ප්‍රේම සම්බන්ධයක සිටීම ගැන ජගත් සිටින්නේ නොසතුටිනි. මරී කමල්ගෙන් වෙන් කිරීමට ජගත් ඇ බලහත්කාරයෙන් ඇදගෙන ගොස් ඔහුගේ නිවසේ කාමරයක සිරකර තබයි. මරී ට පිටත කිසිවකු සමඟ කතාබහ කිරීමට නොහැකි වේ. ජගත් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.



# මුදල් හා දේපළ සම්බන්ධ වැරදි

### සොරකම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 366 වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු තවත් තැනැත්තකුට අයත් දෙයක් එම තැනැත්තාගේ අවසරයෙන් තොරව වංක ලෙස ගැනීම මෙහි අදහසයි.

උදාහරණයක් ලෙස: අශෝක් යොහානිගේ නිවසේ දී යොහානි ට අයිති මුද්දක් මේසය උඩ තිබෙන අයුරු දකියි. එම මුද්ද අතට ගන්නා අශෝක් යොහානි නිවසේ නැති විට දී එය ගැනීම සඳහා ඇගේ නිවසේ ලාච්චුවක සඟවයි. පසුව යොහානි නිවසේ නැති දිනෙක අශෝක් යොහානි ගෙ නිවසට පැමිණ මුද්ද රැගෙන යයි. අශෝක් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### කප්පම් ගැනීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 372 වගන්තිය

මෙහි තේරුම: වටිනාකමින් යුතු දෙයක් ලබා ගැනීමට යම් අයෙකු බිය වැද්දීම මෙහි දී සිදුවේ.

උදාහරණයක් ලෙස: තමාට තුවාල සිදුවන අන්දමින් පහරදෙන බවට පාලිත චමිලාට තර්ජනය කරයි. ඉන් අනතුරුව ඔහු තමාට මුදල් ලබා ගත හැකි චෙක්පතකට ඇගේ අත්සන් ලබා ගනියි. පාලිත මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### මංකොල්ල කෑම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 379 වගන්තිය

මෙහි තේරුම: සොරකමේ යෙදෙන තැනැත්තකු තවත් තැනැත්තකු මරණයට පත්කරන, එම තැනැත්තාට හානි සිදුකරන, හෝ එම තැනැත්තා අයුතු ලෙස සිරකරන, හෝ එවන් දෙයක් සිදුකිරීමට තැත්කරන, හෝ එවන් දෙයක් සිදුකරන බවට පවසා බියවදන්න අවස්ථා මීට ඇතුළත් ය.

උදාහරණයක්: ශෂී බස් නැවතුම්පොලේ හිඳගෙන සිටින විට ලාල් ඇ දෙසට පැමිණෙයි. ලාල් පිහියක් එළියට ගෙන ශෂී ගේ අත කපා ඇගේ මුදල් පසුම්බිය ඉල්ලා බල කරයි. ලාල් මෙම අපරාධයට වරදකරුවකු විය හැකි ය.

### සාපරාධී දේපල අවභාවිතය - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තිය

මෙහි තේරුම: යම් තැනැත්තකු තවත් තැනැත්තකුගේ දේපල වංක ලෙස ලබාගෙන තමාගේ අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීම මෙහි අදහසයි.

උදාහරණයක්: රවී සහ ෆාතිමා ලැප්ටොප් පරිගණකයක් හවුලේ භාවිතා කළහ. එම ලැප්ටොප් පරිගණකය සතියක කාලයකට තමාගේ නිවසට රැගෙන යන බව ෆාතිමා රවී ට පවසයි. ලැප්ටොප් පරිගණකයේ හිමිකාරීත්වය දෙදෙනාටම ඇති නිසා රවී ඊට එකඟ වෙයි. රවීගේ අනුදැනුමෙන් තොරව, ෆාතිමා ලැප්ටොප් පරිගණකය විකුණා ඉන් ලැබුණු මුදල තමාළඟ තබා ගනියි. ෆාතිමා මෙම අපරාධයට වැරදිකාරියක විය හැකි ය.

### සාපරාධී විශ්වාසය කඩකිරීම - ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 388 වගන්තිය

මෙහි තේරුම: දේපලක් කෙරේ විශ්වාසය තැබූ යම් තැනැත්තකු, එම විශ්වාසයේ රෙගුලාසි උල්ලංඝනයවන අන්දමින් එම දේපල අවභාවිතා කිරීම හෝ බැහැර කිරීම මින් අදහස් වේ.

උදාහරණයක්: කවීතා සහ රානී යනු මිතුරියන් ය. කවීතා රැකියාව කරන්නේ ඉන්දියාවේ බැවින් ඇගේ නිවසට රෙදි සේදුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ඈ රානිට මුදල් යවයි. රානී ඊට එකඟ වෙයි, නමුත් ඈ එම මුදලින් තමාට ස්මාර්ට් ජංගම දුරකතනයක් මිලදී ගනියි. රානී මෙම අපරාධයට වැරදිකාරියක විය හැකි ය.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය



යම් තැනැත්තකු නිවසේ දී සහකරුවකු හෝ පවුලේ සාමාජිකයකු කෙරෙහි හානි පමුණුවන හෝ පාලනය කිරීමේ හැසිරීමක් දක්වන අවස්ථාවක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යනුවෙන් හැඳින්වේ. එය ස්වාමිපුරුෂයන් සහ භාර්යාවන්, සහකරුවන්, දෙමාපියන් සහ දරුවන්, සහෝදරයන් සහ සහෝදරියන්, හෝ පවුලේ වෙනත් සාමාජිකයන් අතර සිදුවිය හැකි ය.

මෙය යම් තැනැත්තකුට පහර දීම හෝ ශාරීරිකව වේදනා පැමිණවීමට පමණක් සීමා නොවේ. චිත්තවේගීය අපයෝජනය (අපහාස හෝ තර්ජන), ලිංගික අපයෝජනය, යම් අයෙකුගේ මුදල් පාලනය කිරීම, හෝ ඔවුන් බිය ගැන්වීමට හෝ හුදෙකලා කිරීමට තැත් කිරීම වැනි ආකාර පවා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනේ. මෙය බොහෝ විට නැවත නැවතත් සිදුවන දෙයක්වන අතර, එමගින් වින්දිතයාට බිය, තමා සිර වී ඇති බව, සහ අසරණ වී ඇති බව දැනෙනු ඇත.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ විවිධ ආකාර

## ශාරීරික අපයෝජනය

යම් තැනැත්තකු තම සිරුර හෝ යම් ද්‍රව්‍යයක් භාවිතාකර වෙනත් තැනැත්තකුට රිදවීම මෙහි අදහසයි. පහර දීම, කම්මුලට පහර දීම, පා පහර දීම, ගෙල සිර කිරීම, හෝ විවිධ ද්‍රව්‍ය දමා ගැසීම මේ අතර වේ.

උදාහරණයක් ලෙස: කෞෂි තම මවට දුරකතනයෙන් කතා කළේ යැයි මලිත් කෞෂිට කෑ ගැසුවේය. එදින රාත්‍රියේ, ඔහු ඈ බිත්තියේ හප්පවා ඇගේ උදරයට අතින් පහර දුන්නේය. පසු දින උදෑසන මල් ද රැගෙන පැමිණි මලිත් කෞෂිගෙන් සමාව අයැද සිටි අතර එය ඇගේ වරදින් සිදු වූ බව පැවසුවේය. ඔහුට සමාව දුන් කෞෂි මලිත්ගේ හැසිරීම එම මොහොතේ පැවති උණුසුම්කාරී වාතාවරණය නිසා හටගත්තේ යැයි සිතා ගත්තාය. මලිත් ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනිය හැකි ය.

## චිත්තවේගීය සහ මානසික අපයෝජනය

යම් තැනැත්තකුට බිය ඇතිවන, එම තැනැත්තාට තමා කුඩා යැයි හැඟෙන, හෝ තමාගෙන් වැඩක් නැතිය යැයි හැඟෙන ආකාරයේ වචන හෝ ක්‍රියාවන් මේ යටතට ගැනේ.

උදාහරණයක් ලෙස: සමන් නිතර මේරිට ඈ "මෝඩ" සහ "වැඩක් නැති" කෙනෙකු යැයි පවසයි. මෙය වැඩිපුරම සිදුවන්නේ ඔහු කේන්තියෙන් සිටින විට ය. තමා සමඟ නැවත එකට-එක කිව්වහොත්, හෝ තමා නොමැතිව එළියට ගියහොත් ඈ දමා යන බවට සමන් මේරිට තර්ජනය කළේය. ඔහු ඇගේ ජංගම දුරකතනයට පිවිසුම් ලබාදෙන ලෙස ඉල්ලා සිටි අතර, ඈ සිටින ස්ථානය දිනපතා පරීක්ෂා කළේය. මේරිට තමා සිර වී සිටින බවක්, කාංසාවක්, සහ තනි තීරණයට කිසිවක් සිදුකිරීමට බියක් දැණිනි. සමන්ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනිය හැකි ය.

## ලිංගික අපයෝජනය

යම් තැනැත්තකු තමා සමඟ ලිංගික ක්‍රියාවල නිරතවන ලෙස සහකරුවාට බලකරන්නේ හෝ පීඩා පමුණුවන්නේ නම් එය ලිංගික අපයෝජන යටතට ගැනේ.

උදාහරණයක් ලෙස: හෂිණි සහ තිලිණ විවාහක යුවලක්වන අතර, තිලිණ ඇගේ විරෝධය නොතකා ඈ සමඟ බලෙන් ලිංගිකව හැසිරීමට තැත්කරයි. ඈ "භාර්යාවක් ලෙස ඇගේ කාර්යභාරය ඉටු නොකළහොත්," දරුවන් ද රැගෙන තමා පිටව යන බව තිලිණ හෂිණි ට පැවසුවේය. තමා අපයෝජනයට ලක්ව ඇති බව සහ අසරණ වී බව හෂිණිට දැණුන නමුත් ඊට එරෙහිව කතා කිරීමට බිය වූවාය. ඒ සෑම අවස්ථාවක ම, ඊට පසු දින උදෑසන ඔහු හැසිරුණේ කිසිවක් සිදු නොවුනු ආකාරයෙනි. තිලිණ ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනේ.

ඉහත දැක් වූ ලිංගික ක්‍රියා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ආකාරයක් ගන්නා නමුත් ශ්‍රී ලංකා නීතිය තුළ විවාහය තුළ සිදුවන අපයෝජනය හඳුනා නොගන්නා බව ද සඳහන්කළ යුතු ය.

## මූල්‍ය අපයෝජනය

යම් තැනැත්තකු අනෙක් තැනැත්තා ගේ මුදල් පාලනය කිරීමට හෝ සීමා කිරීමට කටයුතු කරන අවස්ථාවක දී මූල්‍ය අපයෝජනය සිදුවේ.

උදාහරණයක් ලෙස: ප්‍රියාට රැකියාවක නිරතවීම ට රවී ඉඩ ලබා දෙන්නේ නැත. ඔහු පවසන්නේ "හොඳ බිරිඳක් නිවසේ සිටිය යුතු" බව ය. ඔහු ඇගේ සියලු ස්වර්ණාභරණ හා බැංකු කාඩ්පත් තමා සන්තකයේ තබාගත් අතර, ප්‍රියාට සතියකට රු. 1,500 ක පමණ මුදලක් ලබා දුන්නේ ය. සෑම රුපියලකට ම අදාළව රිසිට්පතක් රවීට පෙන්වීමට ඇට සිදු වූ අතර, ඇගේ සෑම වියදමක් ම පැහැදිලි කිරීමට ද සිදුවිය.

තමාට කියා එකඳු රුපියලක් වත් නොමැතිව, ගැලවී යාමට මගක් නොමැති ව තමා අසරණ වී ඇති බව ප්‍රියාට දැණිනි. රවී ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනේ.

### සමාජීය අපයෝජනය

යම් තැනැත්තකු වෙනත් පුද්ගලයන් සමග සබඳකම් පැවැත්වීම වළක්වාලීම හෝ එම තැනැත්තා හුදෙකලා කිරීම සමාජීය අපයෝජනය ලෙස සැලකේ.

උදාහරණයක් ලෙස: නිලූ තම හිතමිතුරන් සමග කතාකරන හෝ සමාජ මාධ්‍යවල පෝස්ටුවක් පළකරන සෑම අවස්ථාවකම අමිත් කෝපාවිෂ්ට වෙයි. ඈ පෙම්බස් කෙලින බවට චෝදනාකළ අමිත් ඈ ලවා ඇගේ සමාජ මාධ්‍ය ගිණුම් මකා දැමීමට කටයුතු කළේය. නිලූට තම දෙමාපියන් බැලීමට යාම ද තහනම්කළ අමිත් ඔවුන් "ඇගේ මනසට විෂබීජ කවා ඇති" බවට චෝදනා කළේය. වරක තමා විශ්වාසය තැබූ සියලු දෙනාගෙන් දැන් වෙන් වී ඇති නිලූට තමා හුදෙකලා වී ඇති බව දැණිනි. අමිත්ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනේ.

### නොසලකා හැරීම

ගෘහස්ථ සබඳතාවයක දී නොසලකා හැරීම යනු තම සහකරුවාගේ මූලික අවශ්‍යතා මගහැර සිටීමයි. ආහාරපාන, වෛද්‍ය සහාය, හෝ චිත්තවේගීය සහාය ලබා නොදීම මේ අතර වේ. එමෙන්ම, සහකරුවා රෝගාතුර වී හෝ අනතුරකට ලක්ව සිටින විට උපකාර කිරීම ප්‍රතික්ෂේපකර සිටීම ද මීට අයත් ය. මෙමගින් කාලයත් සමග, එම තැනැත්තාට තමාට ආදරය නොලැබෙන බව, ආරක්ෂාවක් නොමැති බව, සහ තමා තනි වී ඇති බව දැනෙනු ඇත.

උදාහරණයක් ලෙස: රමණිට අසනීප වූ විට, ඈ වෛද්‍යවරයකු වෙත රැගෙන යාම හෝ ඈ සඳහා ඖෂධ මිලදී ගැනීම අමල් ප්‍රතික්ෂේප කළේය. ආහාර ද නොමැතිව ඈ තනිවම දමා යෑමට හෝ ඈ පිළිබඳ සොයා නොබැලීමට ඔහු නිතර කටයුතු කළේය. ඈ හඬන සෑම විටෙකම, ඈ "නිකම් ඇඬියාවක් පමණක් පෙන්වන" බව පවසා ඈ ගණන් නොගෙන සිටීමට අමල් කටයුතු කළේය. රමණි දිනෙන් දින දුර්වල වූවාය, බලාකියා ගැනීමට කිසිවකුත් නොමැතිව අදෘෂ්‍යමාන චරිතයක් බවට පත්වූවාය. අමල්ගේ ක්‍රියාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතට ගැනේ.



# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ ප්‍රධාන ලක්ෂණ

## බොහෝවිට එය නැවත නැවතත් සිදුවේ

සාමාන්‍යයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය එක්වරක් පමණක් සිදුවන දෙයක් නොවේ. එය බොහෝවිට කුඩාවට ආරම්භ වී කාලයත් සමඟ නරක අතට හැරේ. උදාහරණයක් ලෙස, අපයෝජකයා දබරයක් අතරතුර තම බිරිඳට කෑ ගැසීමෙන් ආරම්භකර, පසුව ඇට පහර දීමට පටන් ගන්නා අතර, ඉන් අනතුරුව ප්‍රචණ්ඩත්වය වඩවඩාත් බරපතල තත්ත්වයට පත්වේ.

## එය පිටුපස තිබෙන්නේ බලය හා පාලනයයි

අනෙක් තැනැත්තාගේ ජීවිතයේ සම්පූර්ණ පාලනය ලබා ගැනීම අපයෝජකයාගේ අරමුණයි. ඇතැම් අවස්ථාවල, තම සහකරුවා රැකියාවක නිරතවීම, හිතමිතුරන් හමුවීම, හෝ දුරකතනය භාවිතා කිරීම නවතා දැමීමට, සහ නිවස තුළ කුමන හෝ තීරණයක් ගැනීම වැළැක්වීමට ඔවුහු කටයුතු කරති. මෙමගින් වින්දිතයාට තමා තනිව ඇති බවක් සහ බියක් දැනීමට ඉඩ ඇත.

## එය බොහෝවිට සැඟවී තිබේ

සාමාන්‍යයෙන් අපයෝජනය සිදුවන්නේ පෞද්ගලික අවකාශයක ය. වෙනත් අයට දැනුම් දීමට වින්දිතයාට බියක් හෝ ලැජ්ජාවක් දැනිය හැකි ය. උදාහරණයක් ලෙස, තම කැළැල් වසා ගැනීමට ඇඳුම් පැළඳුම් හැඳ රූපලාවන්‍ය නිශ්පාදන භාවිතා කිරීමට ඇතමෙකු කටයුතු කළ හැකි අතර, සිය සහකරු අතින් පහර කෑමට ලක්වූව ද, තමා ඇද වැටීමෙන් එම කැළැල් ඇති වූ බව අනෙකාට පැවසීමට ඔවුන් කටයුතු කරනු ඇත.

## එය චක්‍රයක් ලෙස සිදුවේ

අපයෝජනය සිදුවන බොහෝ සබඳතාවල නැවත නැවතත් හටගන්නා රටාවක් පවතියි: ආතතිය ගොඩනැඟීම, ප්‍රචණ්ඩත්වය හටගැනීම, අපයෝජකයා සමාව අයැද ආදරණීය ලෙස හැසිරීම, සහ නැවත ආතතිය ගොඩනැඟීම. උදාහරණයක් ලෙස, තම සහකරුවාට රිදවූ පසු, ඔවුන්ගෙන් සමාව අයැදීමට සහ තමා වෙනස්වන බව පොරොන්දු වීමට අපයෝජකයා කටයුතු කරන අතර, ඉන් යම් කාලයකට පසු අපයෝජනය යළි ආරම්භ වීම සිදුවේ.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ මිථ්‍යාමත සහ සත්‍ය කරුණු

**මිථ්‍යාමත 1: "එය එක් වරක් පමණක් සිදුවූවා නම් කමක් නැත - එය නිකම් අතපසු වීමකි."**

සත්‍යය: ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හටගන්නා එක් සිදුවීමක් වුව ද බරපතල ය. අපයෝජනය කිසිවික අනුමතකළ නොහැකි අතර, "එක්වරක් පමණක් සිදුවූයේ" යැයි කියන සිදුවීම නැවත නැවතත් හටගන්නා පාලනය කිරීමේ හා හානි පැමිණවීමේ රටාවක් දක්වා වර්ධනයවිය හැකි ය. සෑම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවකින් ම ශාරීරික හා චිත්තවේගීය හානියක් සිදුවිය හැකි අතර එය බරපතල ලෙස සැලකිල්ලට ගත යුතු ය.

**මිථ්‍යාමත 2: "ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පෞද්ගලික කරුණකි - පිටස්තරයන් මැදිහත්වීම අවශ්‍ය නැත."**

සත්‍යය: ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අපරාධයකි, එය පෞද්ගලික කරුණක් නොවේ. එහි බලපෑම වින්දිතයාට පමණක් සීමා නොවන අතර, දරුවන්, පවුලේ සාමාජිකයන්, සහ පුළුල් ප්‍රජාවටම බලපෑ හැකි ය. මැදිහත්වීමක් සිදුකොට සහයෝගය ලබාදීම මඟින් ජීවිත බේරාගත හැකි අතර වැඩිදුර හානි පැමිණවීම වළක්වාගත හැකි ය.

**මිථ්‍යාමත 3: "වින්දිතයා එය කෙසේ හෝ අවුලුවන්න ඇති."**

සත්‍යය: කිසිවිටක යම් තැනැත්තකුගේ අපයෝජන ක්‍රියාවන්වලට වෙනත් තැනැත්තකු වගකිවයුතු නැත. අපයෝජනය යනු බලය හා පාලනය අතට ගැනීම පිණිස අපයෝජකයා විසින් ගනු ලැබූ තීරණයකි. වින්දිතයාට වරද පැටවීම මඟින් හානිය සිදුකළ තැනැත්තාගෙන් වගකීම ගිලිහී යාම සිදුවේ.

**මිථ්‍යාමත 4: "මධ්‍යසාර හෝ මත්ද්‍රව්‍ය නිසා පමණක් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතිවේ."**

සත්‍යය: මත්ද්‍රව්‍ය භාවිතයෙන් අපයෝජනය වඩාත් නරක අතට හැරෙන නමුත් එය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට හේතු නොවේ. බොහෝ පුද්ගලයෝ මධ්‍යසාර හෝ මත්ද්‍රව්‍ය භාවිතාකර ප්‍රචණ්ඩකාරී නොවී සිටිති. අපයෝජනය යනු යම් තැනැත්තකු පාලනය කිරීමට හෝ එම තැනැත්තාට හානි පැමිණවීමට තවත් තැනැත්තකු විසින් සිතාමතාම ගනු ලබන තීරණයක් මිස, හුදෙක් මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵලයක් නොවේ.

## එසේනම්, වින්දිතයන් තම සබඳතාවයේ දිගටම රැඳී සිටින්නේ ඇයි?

- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයන් බොහෝවිට තම සහකරුවන් සමග රැඳී සිටින්නේ ඔවුන් දක්වන බිය නිසා ය. බොහෝදෙනෙක් තමා පලා යාමට තැත්කළහොත් කුමක් සිදුවනු ඇතිදැයි බිය වෙති, ඇතැම් අපයෝජකයෝ ඔවුනට, ඔවුන්ගේ දරුවන්ට පමණක් නොව තමාටම පවා හානි පමුණුවා ගන්නා බවට තර්ජනය කරති. විශේෂයෙන් අපයෝජකයා විසින් දැනටමත් ප්‍රචණ්ඩකාරී හැසිරීම් පෙන්නුම් කර තිබේ නම්, මෙම බිය ඉතා බරපතල විය හැකි ය.

- වැඩක් නැති බව හෝ තමා අනෙකා මත යැපෙන බව හැඟවීමට අපයෝජකයෝ බොහෝවිට කටයුතු කරති. වින්දිතයන් රැකියාවක නිරතවීම නතරකර දැමීමට, ඔවුන්ගේ මුදල් පැහැර ගැනීමට, හෝ ඔවුනට තනිවම ජීවත්විය නොහැකි බව විශ්වාස කරවීමට අපයෝජකයෝ කටයුතුකළ හැකි ය. කාලය ගතවීමත් සමග, වින්දිතයාගේ විශ්වාසය බිඳ වැටෙන අතර, තමාට උපකාර ලබා ගැනීමටවත් ශක්තියක් නොමැති හෝ ලැජ්ජාවක් ඇතිවන තත්ත්වයක් උදාවිය හැකි ය.

- හැරගියහොත් ඔවුනට යාමට ආරක්ෂිත ස්ථානයක් නොමැති වේ යැයි දැනෙන කණස්සල්ල හේතුවෙනි. ජීවත්වීමට නිවසක් නොමැති වී, ජීවත් වීමට අවශ්‍ය තරම් මුදල් ද නොමැති වී, තම දරුවන්ගේ භාරකාරත්වය පවා තමාට අහිමි වී යනු ඇතැයි ඔවුන් බියවීමට ඉඩ ඇත. ඇතැම්විට, ඔවුනට ළඟපාත පවුලේ සාමාජිකයකු හෝ හිතමිතුරන් ආදිය නොමැතිවිය හැකි ය, නැතහොත් ඔවුනට තත්ත්වය තේරුම්ගත නොහැකිවිය හැකිය, එසේත් නැතහොත්, උපකාර කරනු වෙනුවට වින්දිතයාට දොස් පැවරිය හැකි ය. මෙම හුදෙකලාව නිසා වින්දිතයන්ට තනිකමක් සහ බියක් දැනෙන අතර, තමාගේ කතාව කවුරුන් විශ්වාස කරාවි ද, හෝ ජීවිතය යළි ආරම්භ කිරීමට අවශ්‍ය සහයෝගය නොලැබේවි ද යන අවිනිශ්චිතතාව ඇතිවිය හැකි ය. ආරක්ෂිත ස්ථානයක් හෝ විශ්වාසදායක සහයෝගයක් නොමැතිව, පලා යාමේ අදහස ප්‍රායෝගික නොවේ යැයි ඔවුනට හැඟී යා හැකි ය.

- බොහෝ වින්දිතයන් රැඳී සිටින්නේ ආදරය, බලාපොරොත්තුව හෝ වරදකාරී හැඟීම නිසා ය. ඔවුහු තවමත් තම සහකරු ගැන සිතීමට ඉඩ ඇති අතර, ඉදිරියේ දී මෙම තත්ත්වයන් වෙනස්වනු ඇතැයි බලාපොරොත්තු වෙති. විශේෂයෙන් ම සිදුවීමට අදාළව අපයෝජකයා චෝදනා පමුණුවන්නේ තමාට නම්, ඇතැම්හු අපයෝජනය තමාගේ වරදක් බවට විශ්වාස කරති.



- බොහෝ වින්දිතයෝ තම දරුවන් පිළිබඳ සිතා, හෝ පවුලෙන්, ආගමෙන්, හෝ සමාජයෙන් එන පීඩනය පිළිබඳ සිතා රැඳී සිටිති. පිටින් පෙනනවාට වඩා පලා යාම බොහෝවිට බොහෝ අසීරු යැයි ඔවුනට දැනෙනවා විය හැකි ය.

# ඔබ දන්නා කෙනෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ වින්දිතයකු නම් ඔබට කළ හැක්කේ කුමක්ද?

### උපකාර ලබා ගන්න

හිතමිතුරකු, පවුලේ සාමාජිකයකු, ගුරුවරයකු, හෝ උපදේශකවරයකු වැනි ඔබට විශ්වාසය තැබිය හැකි අයකු සමඟ කතා කරන්න. ඔබගේ අත්දැකීම බෙදාගැනීමෙන් ඔබට චිත්තවේගීය සහාය ලබාගත හැකි සේම ඔබට දැනෙන හුදෙකලා බව ද අවම කරගත හැකි ය.

### ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ක්ෂණික ඇමතුම් සේවාවක් අමතන්න

ක්ෂණික ඇමතුම් සේවාවන්වලින් රහසිගත, විනිශ්චයකින් තොර උපදෙස් ලබාගත හැකි අතර, ආරක්ෂිත ස්ථානයක්, නීති සහාය, සහ උපදේශනය වැනි සම්පත් කෙරේ යොමුවීමට ඔබට උපකාරකළ හැකි ය. (XX පිටුව බලන්න)

### ආරක්ෂිත සැලැස්මක් සකස් කරන්න

ආරක්ෂිත ස්ථානයක් හඳුනා ගැනීම, අත්‍යාවශ්‍ය ලියකියවිලි (ඔබගේ උප්පැන්න සහතිකය සහ ජාතික හැඳුනුම්පත වැනි), මුදල්, අත්‍යාවශ්‍ය ඖෂධ, ඇඳුම් කිහිපයක්, සහ ඔබට නැතිකර ගැනීමට නොහැකි ඕනෑම වැදගත් යමක් යනාදියෙන් සමන්විත අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රැගත් බෑගයක් සූදානම්කර ගැනීම, සහ හදිසි දුරකතන අංක මතකයේ තබා ගැනීම යෝග්‍ය ය. මෙම සූදානම, ඔබට පිටව යාම වඩාත් ආරක්ෂිත සහ පහසු කරවනු ඇත.

### වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න

ඔබට රිදවා ඇති නම්, වහා වෛද්‍යවරයකු වෙත යොමුවන්න. ඔබ ඉදිරියේ දී නීතිමය ක්‍රියාමාර්ග ගන්නේ නම්, වෛද්‍ය වාර්තා සාක්ෂි ලෙස ඉදිරිපත්කළ හැකි ය, එමෙන්ම, සෞඛ්‍ය සේවා සපයන්නකු හට ඔබට සහයෝගය ලබාගත හැකි සේවාවන් වෙත යොමුකළ හැකි ය.

### බලධාරීන්ට වාර්තා කරන්න

ඔබට ආරක්ෂිත යැයි හැඟෙන්නේ නම්, ළඟම තිබෙන පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා කටයුතු අංශය වෙත ගොස් ඔබ මුහුණදුන් අපයෝජනය වාර්තා කරන්න, නැතහොත් කාන්තා හා ළමා කාර්යාංශය වෙත වාර්තා කරන්න. (XX පිටුව බලන්න)

### විවෘත සන්නිවේදනය දිරිගන්වන්න

ඔබ වෙනත් තැනැත්තකුට උපකාර කරන්නේ නම්, ඔවුන් තනි වී නැති බව එම තැනැත්තාට දැනුම් දෙන්න, ඔබ ඔවුන් විශ්වාස කරන බව දැනුම් දෙන්න. විනිශ්චයකින් තොරව ඔවුන්ගේ කතාවට සවන් දෙන්න, ඔවුන්ගේ හැඟීම් සහ තීරණවලට ගරු කරන්න.

### විනිශ්චය හා පීඩනය මඟහරින්න

අපයෝජනය සිදුවන සබඳතාවයකින් ඉවත්වීම සංකීර්ණ සහ බොහෝවිට භායනක වියහැකි බව අවබෝධකර ගන්න. ඔබගේ ආදරණීයයකු මෙවන් තත්ත්වයකට මුහුණ දී සිටී නම්, ඔවුන්ගේ සූදානමක් නොමැති ව ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා බල නොකරන්න, ඒ වෙනුවට ඔබගේ සහයෝගය ලබාදෙන්න. ඔවුන් ගමන්කරන වේගය, ඔවුන්ගේ තේරීම්, සහ ඔවුන් බලාපොරොත්තුවන ආරක්ෂාවට ගරු කරන්න. ඔබ පිටව යාම පිළිබඳ සලකා බලන්නේ නම්, නැතහොත් දැනටමත් එම තීරණය ගෙන ඇතිනම්, ඔබ ඔබ සමඟ ම මෘදුව කටයුතු කරන්න. මෙම ගමන අසීරුයි සහ නිර්භීතයි! ඔබට සහයෝගය ලබා දෙන පුද්ගලයන් සිටිනු ඇත.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති

**2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් ජනතාව ආරක්ෂා කිරීමට උපකාරීවන ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීතියයි. මෙම නීතියෙන්, තුවාල ලැබූ හෝ අනතුරට පත්ව සිටින තැනැත්තන්ට මහේස්ත්‍රාත් අධිකරණයෙන් උපකාර සහ ආරක්ෂාව ඉල්ලා සිටීමට ඉඩ ලබා දේ.**

මෙම පනත අනුව, "ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය" යනු:

කාලත්‍රයකු, සහකරුවකු, හෝ පවුලේ සාමාජිකයකු විසින් නිවසේ සිටින තවත් පුද්ගලයකුට හානි පමුණුවන හෝ හානි පැමිණවීමට තර්ජනය කරන ඕනෑම ක්‍රියාවක් මේ යටතට ගැනේ. මෙම හානිය ශාරීරික, ලිංගික, චිත්තවේගීය පමණක් නොව මූල්‍යමය පවා විය හැකි ය. ඊට පහරදීම, ලිංගික අපයෝජනය, නිරන්තර අපහාස හෝ තර්ජන, සහ යම් තැනැත්තකුගේ මුදල් පාලනය කිරීම වැනි දෑ ඇතුළත් වේ. මුදල් හෝ දේපල කොල්ල කා ගැනීම වැනි අරමුණු ඇතිව යම් තැනැත්තකු බිය වැද්දීමට හෝ පීඩනයට ලක් කිරීමට අදහස් කරන ක්‍රියා ද මෙම නීතියෙන් ආවරණය කරයි. එබැවින්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යනු හුදෙක් පහරදීම පමණක් නොවේ, පුද්ගලයකුගේ ශරීරයට හෝ මනසට හානි පමුණුවන බොහෝ ආකාරයේ අපයෝජනයන් ඊට ඇතුළත් වේ.

### ආරක්ෂක ආඥාවක් යනු කුමක්ද?

පනතේ 11 වන වගන්තිය - ආරක්ෂක ආඥාවක් යනු වින්දිතයකු හෝ එම වින්දිතයාට සහායවන ඥාතියකු, හිතමිතුරකු, සමාජ සේවකයකු හෝ සෞඛ්‍ය නිලධාරියකුට එරෙහිව තවදුරටත් ප්‍රචණ්ඩ ක්‍රියා දියත් කිරීම වළක්වාලමින් මහේස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන නියෝගයකි.

මෙහි අරුත: ආරක්ෂක ආඥාවක් යනු, අපයෝජකයා වින්දිතයාගෙන් දුරස්ව තැබීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරනු ලබන නීතිමය ලියවිල්ලකි. වින්දිතයාගේ නිවසින්, රැකියා ස්ථානයෙන්, හෝ පාසලින් දුරස්ව සිටින ලෙස අපයෝජකයාට නියෝග කිරීමට එම ලියවිල්ලට හැකියාව ඇත. වින්දිතයා ඇමතීමට හෝ එම තැනැත්තාට කුමන හෝ ආකාරයකින් තර්ජනය කිරීමට අපයෝජකයා කටයුතු කිරීම වැළැක්වීමට ද එම නියෝගයට හැකියාව ඇත.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත්විඳින පුද්ගලයන්ට ආරක්ෂාව සහ හිත සැහැල්ලු කිරීම සඳහා ආරක්ෂක ආඥා නිකුත් කරනු ලබයි. අපයෝජකයා එම ආඥාව කඩ කළහොත්, ඔවුනට දඩ මුදල් හෝ සිරදඬුවම් වැනි නීතිමය ප්‍රතිවිපාකවලට මුහුණ දිය හැකි ය. වින්දිතයන්ට අධිකරණයෙන් ආරක්ෂක ආඥාවක් ඉල්ලා සිටිය හැකි අතර, බොහෝවිට, එය ඉක්මනින් නිකුත් කිරීම සිදුවේ. එමෙන්ම, ඇතැම් අවස්ථාවල අපයෝජකයා නොමැතිව පවා මෙම ආඥාව ලබාගත හැකි වේ.

දරුවාගේ යහපත වෙනුවෙන් සෙතක් සිදුවේ නම්, අපයෝජකයාට දරුවා සමඟ කතා කිරීම තහනම් කිරීම පවා ආරක්ෂක ආඥාවකට සිදුකළ හැකි ය.

**මතක තබාගන්න: ඔබ වෙනුවෙන් අධිකරණය විසින් ආරක්ෂක ආඥාවක් නිකුත්කළ විට, එහි පිටපතක් නීතිඥයකු මාර්ගයෙන් ඔබට ලබාගත හැකි ය. ඔබ වෙනුවෙන් ආඥාවේ පිටපතක් ඉල්ලා සිටීමට නීතිඥයාට හැකියාව ඇත.**

2 වන වගන්තියේ සඳහන් පරිදි, වින්දිතයාට හෝ පොලීසියට ආරක්ෂක ආඥාවක් ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට අයදුම්කළ හැක. මින් අදහස් කරන්නේ, වින්දිතයකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයේ සිදුවීමක් වාර්තා කිරීමට පොලීසියට ගියහොත්, පොලීසිය වින්දිතයා වෙනුවෙන් ආරක්ෂක අඥාවක් ලබා ගැනීම සඳහා අයදුම්පතක් ගොනු කිරීමෙන් සහාය විය යුතු බවයි. නීතිය අනුව, පොලීසිය වින්දිතයාට මේ අන්දමින් උපකාර කිරීමට නීත්‍යානුකූලව බැඳී සිටියි. කෙසේවෙතත්, බොහෝ අවස්ථාවල දී, මෙවන් සිදුවීමක් "පවුල් ආරවුලක්" ලෙස හඳුන්වමින් වින්දිතයන් අධෛර්‍යමත් කිරීමට පොලීසිය උත්සාහ කරයි, නමුත් පොලීසිය තවමත් මෙම උපකාරය ලබා දීමට නීත්‍යානුකූලව බැඳී සිටින අතර, වින්දිතයන් ආපසු හරවා එවීමට පොලීසියට හැකියාවක් නැත.

පොලීසිය ඔබට අවශ්‍ය සහාය ලබා නොදෙන බව ඔබට හැඟේ නම්, නීතිඥවරයකු සම්බන්ධකර ගැනීම වැදගත් වේ. වාර්තා කිරීමේ ක්‍රියාවලිය තුළ සෑම පියවරක් හරහාම ඔබට මඟපෙන්වීමට සහ ඔබට හිමි අයිතීන් සුරක්ෂිත බව සහතික කිරීමට නීතිඥවරයකුට හැකි ය. පොලිස් ස්ථානය තුළ ඔබ වෙනුවෙන් නීතිමය නියෝජනයක් පැවතීමේ ප්‍රතිලාභ කිහිපයක් තිබේ:
ඔබේ නඩුව පැහැදිලි ව ඉදිරිපත් කිරීමට, ඕනෑම බියවැද්දීමක් හෝ වැරදි සන්නිවේදනයක් වළක්වා ගැනීමට, සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව සහතික කිරීමට ඔබගේ නීතිඥවරයාට හැකියාව ඇත. ඔබ වෙනුවෙන් පෙනී සිටීමට, ඔබට අදාළ නීතිමය විකල්ප අවබෝධකර ගැනීමට උදව් කිරීමට, සහ ආරක්ෂක අඥා ලබා ගැනීම හෝ වෙනත් හදිසි ක්‍රියාමාර්ග වෙත යොමු වීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ද නීතිඥවරයාට හැකියාව ඇත.

නොමිලේ නීතිඥවරයකු සොයා ගත හැකි ස්ථානය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා අපගේ සේවා පිටුව වෙත පිවිසෙන්න.

## ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීමක් වාර්තා කිරීම

හැකි සෑම විටම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිද්ධීන් වාර්තා කළ යුතුය, මන්ද එසේ කිරීමෙන් ජනතාව තවදුරටත් හානිවලින් ආරක්ෂා කර ගත හැකිය. වාර්තා කිරීමට ඔබට ප්‍රමාණවත් තරම් ආරක්ෂිත බවක් දැනේ නම්, වින්දිතයා ආරක්ෂාකර අපයෝජනය නැවැත්වීමට පොලීසියට මැදිහත් විය හැකිය. වාර්තා කිරීම මඟින්, ප්‍රචණ්ඩත්වය කිසිවිටක අනුමත කළ නොහැකි බවට පණිවිඩයක් ලබා දෙන අතර, අපයෝජකයාට තම හැසිරීම වෙනස් කිරීම සඳහා අවශ්‍ය සහාය හෝ නීතිමය ප්‍රතිවිපාක ලැබෙන බව සහතිකකළ හැකි ය. හඬ අවදි කිරීමෙන්, අපගේ නිවෙස් හා ප්‍රජාවන් සෑමදෙනෙකුට ම වඩාත් ආරක්ෂිත කිරීමට අපට දායකවිය හැකි ය.

## වහා අනතුරුදායක අවස්ථාවක දී

- පොලිස් හදිස් ඇමතුම් සේවාව අමතන්න - 119.
- ළඟම ඇති පොලිස් ස්ථානය, හෝ පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කටයුතු අංශය වෙත යන්න.
- රජයේ රෝහලක වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන්න; තුවාල පිළිබඳ ලේඛනගත කිරීමට වෛද්‍යවරුන්ට හැකියාව ඇත.

### ආරක්ෂිත ස්ථාන

- රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවනු ලබන ආරක්ෂිත ස්ථානයකට යන්න. උදාහරණ පහත දැක්වේ:

විමෙන් ඉන් නීඩ් (Women In Need: WIN) - 0112 671 411
ලීඩ්ස් (LEADS) - 0114 000 259

# සයිබර් අපරාධ



## සයිබර් අපරාධ යනු මොනවා ද?

පරිගණක, වෙබ්අඩවි හා අන්තර්ජාලය වැනි ඩිජිටල් තාක්ෂණය යොදාගනිමින් මිනිසුන් විසින් අනෙක් අයට හානි සිදුවන පරිදි නීති විරෝධී ක්‍රියාවන්වල නිරත වීම සයිබර් අපරාධවල දී සිදුවේ. සිත් රිදවන පණිවිඩ හෝ ලිංගික පණිවිඩ යැවීම, අනවසරයෙන් පෞද්ගලික ඡායාරූප යැවීම, පෞද්ගලික තොරතුරු හෝ දත්ත සොරකම් කිරීමට යම් අයෙකුගේ ඊමේල් ගිණුම හැක් කිරීම, හෝ පුද්ගලයකුගේ සමාජභාවය හෝ ලිංගිකත්වය මත පදනම්ව ලැජ්ජා කරවීමට කටකතා පැතිරවීම මීට ඇතුළත් විය හැකි ය. මේවා මාර්ගගත-අඩත්තේට්ටම් හෝ කෙණහිලිකම් ලෙස සැලකිය හැකි ය.

# සයිබර් අපරාධ ආකාර

## අවමාන තර්ජන (බ්ලැක්මේල්):

යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුගේ චරිතය ඝාතනය කරන හෝ පෞද්ගලික තොරතුරු එළියට දමන බවට තර්ජනය කරමින් එම තැනැත්තා ලවා යමක් කරවා ගැනීම මින් අදහස් වේ. ඕනෑම ඇප් එකක හෝ වෙබ්අඩවියක හුවමාරුවන පණිවිඩ, ඡායාරූප, හෝ වීඩියෝපට මීට ඇතුළත්විය හැකි ය.

උදාහරණයක්: චන්දන මරියම්ගේ පරිගණකයට නීති විරෝධී ලෙස ඇතුල් වී ඈ අපහසුතාවයට පත්කරන ඡායාරූපයක් සොයාගනියි. තමාට මුදල් ලබා නොදුන්නොත් එම ඡායාරූපය සමාජ මාධ්‍යයට මුදා හරින බවට චන්දන මරියම්ට තර්ජනය කරයි. චන්දනගේ හැසිරීම අවමාන තර්ජන යටතට ගැනේ.

## සයිබර්-කෙණහිලිකම්

මිනිසුන් විසින් අන්තර්ජාලය භාවිතාකර අනෙක් අයට කෙණහිලිකම් කොට ඔවුන් අපහසුතාවයට පත් කිරීම හෝ ඔවුනට තමා පිළිබඳ කලකිරීමක් ඇතිකරවීම මෙහි අදහසයි. මෙය ඊමේල්, සමාජ මාධ්‍ය, හෝ වෙබ් අඩවි ඔස්සේ සිදුවිය හැකි ය.

උදාහරණයක්: කපිල නිරන්තරයෙන් චමිලාට බියජනක පණිවිඩ යවමින් ඇගේ නිවසේ ලිපිනය හා දුරකතන අංකය වෙබ්අඩවියක පළකරන බවට තර්ජනය කරයි. කපිල චමිලාගේ නමින් පෙනී සිටිමින් බොරු සමාජ මාධ්‍ය ගිණුමක් ද විවෘත කර තිබේ. කපිලගේ හැසිරීම සයිබර්-කෙණහිලිකම් යටතට ගැනේ.

## සයිබර්-ලුහුබැඳීම

යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකු යන්නේ කොහේද, කරන්නේ මොනවා ද යන්න අන්තර්ජාලය ඔස්සේ සොයාබලමින්, එම තැනැත්තාගේ පෞද්ගලිකත්වය හාරා අවුස්සමින් එම තැනැත්තා අපහසුතාවයට පත් කිරීම හෝ එම තැනැත්තාට අනාරක්ෂිත බවක් ඇති කිරීම මින් අදහස් වේ.

සයිබර්-ලුහුබැඳීමට සම්බන්ධ හැසිරීම්වලට විරුද්ධව නඩු පැවරීමට 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනතේ වගන්ති බොහොමයක් පවතී. යම් පුද්ගලයකුගේ පරිගණකය හෝ මාර්ගගත ගිණුම් රහසිගත ව විවෘත කිරීම මෙම පනත යටතේ නීති විරෝධී ය.

උදාහරණයක්: මංජිත් ඔහුගේ මිතුරියක වන නතාශා යන්නේ කොහේද, හමුවන්නේ කාවද යන්න සොයා බැලීමට ඇප් එකක් භාවිතයෙන් ඇගේ ගමන්මග ලුහුබඳියි. මංජිත් තමා ලුහුබඳින බව නතාශා නොදනියි. මංජිත් ගේ හැසිරීම සයිබර්-ලුහුබැඳීම යටතට ගැනේ.

## සයිබර්-අඩත්තේට්ටම්

මිනිසුන් විසින් වෙනත් පුද්ගලයකුට නරක හෝ වේදනාකාරී දේවල් පැවසීම සඳහා මාර්ගගත අවකාශය භාවිතා කිරීම, සහ එම පුද්ගලයා අපහසුතාවයට පත්කරන හෝ වැරදි තොරතුරු මුදා හැරීම මින් අදහස් වේ. දුරකතන සංවාද, සමාජ මාධ්‍ය, ක්‍රීඩා, සහ වෙනත් මාර්ගගත අවකාශවල මෙය සිදුවිය හැකි ය.

උදාහරණයක්: තෙරුණි කසුනිගේ සිරුරේ හැඩය සහ බර ගැන අපහාසාත්මක අදහස් ඇගේ ඉන්ස්ටග්‍රෑම් ගිණුමේ කමෙන්ට් කරයි. තෙරුණිගේ හැසිරීම සයිබර්-අඩත්තේට්ටම් යටතට ගැනේ.

## අනුමැතියෙන් තොර අනවශ්‍ය රූප මාධ්‍ය යැවීම (සයිබර්ෆ්ලෑෂිං)

යම් තැනැත්තකුට එම තැනැත්තාගේ අවසරයෙන් තොරව නුසුදුසු රූප මාධ්‍ය (බොහෝ විට නිරුවත් හෝ ලිංගික ඡායාරූප හෝ වීඩියෝපට) යැවීම මින් අදහස් වේ.

උදාහරණයක්: ප්‍රශාන් තම නිරුවත් ඡායාරූප කෙටි පණිවිඩ ඔස්සේ වසන්ති ට යවයි. ප්‍රශාන්ගේ හැසිරීම සයිබර්ෆ්ලෑෂිං යටතට ගැනේ.

## පොළඹවා ගැනීම (ග්‍රෑමිං)

වැඩිහිටි තැනැත්තකු විසින් දරුවකු හෝ වයසින් බාල තැනැත්තකු සූරාකෑමට ලක්කිරීම හෝ අපයෝජනය කිරීම සඳහා පුහුණු කිරීමේ, හැසිරවීමේ හෝ සූදානම් කරවීමේ අරමුණින් එම තැනැත්තා සමග මාර්ගගතව මානසික සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම මින් අදහස් වේ.

උදාහරණයක්: වැඩිහිටියකු වන කමනි, ෆේස්බුක් තුළ වයස අවුරුදු 15 ක ගැහැණු ළමයෙකු ලෙස පෙනී සිටිමින් එම වයසේ ම ගැහැණු ළමුන් සමග මිතුරු වෙයි. ඉන් අනතුරුව ඇ ඔවුන් සමග ලිංගික ක්‍රියා පිළිබඳ කතාබස් කර, ඔවුන්ගේ ලිංගික අත්දැකීම් හෝ ෆැන්ටසි පිළිබඳ කතා කිරීමට පොළඹවා ගනියි. කමනිගේ හැසිරීම ග්‍රෑමිං යටතට ගැනේ.

## අනන්‍යතාව සොරකම් කිරීම

යම් තැනැත්තකු වෙනත් තැනැත්තකු ලෙස මාර්ගගත අවකාශයේ පෙනී සිටීම මින් අදහස් වේ. මිනිසුන් රැවටීමට, මුදල් සොරාගැනීමට, හෝ නීති විරෝධී වැඩ කිරීමට ඔවුන් පෙනී සිටින තැනැත්තාගේ නම හෝ පෞද්ගලික තොරතුරු භාවිතාකළ හැකි ය.

මාර්ගගත අවකාශයේ වෙනත් තැනැත්තකු ලෙස පෙනී සිටිමින් මිනිසුන් රැවටීම, 2024 අංක 09 දරණ මාර්ගගත සුරක්ෂිතතා පනතේ 18 වන වගන්තිය යටතේ නීති විරෝධී ය. වෙනත් පුද්ගලයකු ලෙස පෙනී සිටීම, වෙනත් පුද්ගලයකුගේ අනන්‍යතාව භාවිතා කිරීම, හෝ ඔබ වෙනත් පුද්ගලයකු යැයි මිනිසුන්ට ඒත්තු ගැන්වීම මීට අයත් ය.

යම් තැනැත්තකු මාර්ගගත අවකාශයේ ඔබ මෙන් පෙනී සිටින බව ඔබ දැනගතහොත්, මෙම නීතිය යටතේ ඔබට ආරක්ෂාව ලබාගත හැකි ය.

උදාහරණයක්: සමාධි බැංකුකරුවකු ලෙස පෙනී සිටිමින් ප්‍රියන්තිගේ පින් අංකය හා මුරපදය ඇතුළු බැංකු තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලා ප්‍රියන්තිට ඊමේල් පණිවිඩයක් යවයි. ඉන් අනතුරුව මෙම තොරතුරු භාවිතාකර සමාධි ප්‍රියන්තිගේ ගිණුමෙන් මුදල් සොරකම් කරයි. සමාධි අනන්‍යතාව සොරකම් කිරීමට වැරදිකාරියක විය හැකි ය.

## පින්තූර භාවිතාකර ලිංගික අපයෝජනය කිරීම

යම් තැනැත්තකුගේ පෞද්ගලික හෝ රහස්‍ය ඡායාරූප එම තැනැත්තාගේ අනුමැතියෙන් තොරව මුදා හැරීම මින් අදහස් වේ.

1947 අංක 04 දරණ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනතේ 02 වන වගන්තිය අනුව, “වෙළඳාම පිණිස හෝ වෙළඳාමක් වශයෙන් හෝ බෙදාහැරීම සඳහා හෝ මහජන ප්‍රදර්ශනය සඳහා හෝ දක්වා ඇති හෝ දක්වා නොමැති කාර්ය සඳහා හෝ අසභ්‍ය ලියවිලි, චිත්‍ර, මුද්‍රිත ඡායාරූප, සිතුවම්, මුද්‍රිත ද්‍රව්‍ය, පින්තූර, විශාල දැන්වීම්, ලාංඡන, ඡායාරූප, සිනමා පටි, රූපවාහිනී කැසට් පට හෝ වෙනයම් අසභ්‍ය දේ සෑදීම, නිශ්පාදනය කිරීම හෝ තමා සන්තකයේ තබා ගැනීම” නීති විරෝධී ය. මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහයේ 286අ වගන්තිය අනුව, ඡායාරූප හෝ චිත්‍රපට සාදන තැනැත්තකු එම නිශ්පාදනවල දරුවකුගේ අශිෂ්ට හෝ අසභ්‍ය ඡායාරූප ඇති බව හඳුනාගත්තොත්, වහාම ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතු ය.

උදාහරණයක්: කසුන් තම හිටපු පෙම්වතියවන කවින්දිගේ රහස් ඡායාරූප ඇගේ මිතුරන් සමග හා වෙබ්අඩවිවල හුවමාරු කරයි. කසුන්ගේ හැසිරීම පින්තූර භාවිතයෙන් ලිංගික අපයෝජනය කිරීම යටතට ගැනේ.

## ලිංගික කප්පම් ගැනීම (සෙක්ස්ටෝර්ෂන්)

යම් තැනැත්තකුගේ රහස්‍ය ඡායාරූප හෝ වීඩියෝපට මුදා හරින බවට එම තැනැත්තාට තර්ජනය කරමින් තවත් තැනැත්තකු විසින් එම තැනැත්තාගෙන් මුදල්, තවත් ඡායාරූප හෝ වෙනත් ඉල්ලීම් ලබා ගැනීමට කටයුතු කිරීම මින් අදහස් වේ.

උදාහරණයක්: තමාට මුදල් ලබා නොදෙන්නේ නම් පවනිගේ නිරුවත් ඡායාරූප මුදා හරින බවට අහ්මඩ් පවනිට තර්ජනය කරයි. අහ්මඩ් ගේ හැසිරීම ලිංගික කප්පම් ගැනීම යටතට ගැනේ.

## මාර්ගගත ජාවාරම

මිනිසුන් විසින් අන්තර්ජාලය භාවිතාකර අන් අය රවටා ඔවුන් ජාවාරම්වලට සම්බන්ධ කිරීම හෝ ඔවුනට රිදවීම වැනි අනාරක්ෂිත හෝ නුසුදුසු තත්ත්වයන්ට ඇද දැමීම මින් අදහස් කෙරේ.

උදාහරණයක්: මැලේසියාවේ හෝටලයක ලාභදායී රැකියාවක් ලබා දෙන බවට පොරොන්දු වී, ප්‍රියංග නැමැත්තා නිපුනිට ඊමේල් පණිවිඩයක් යවයි. මින් බොහෝ සතුටට පත්වන නිපුනි මැලේසියාවට පැමිණීමට එකඟ වෙයි. ඈ පැමිණි පසු, ප්‍රියංග ඇගේ ගමන් බලපත්‍රය ලබාගෙන ඉතා දුෂ්කර තත්ත්ව යටතේ ලිංගික ශ්‍රමිකයකු ලෙස වැඩ කරන මෙන් නිපුනිට බලකර සිටියි. පිටව යාමට විදියක් නොමැති නිපුනිට තම පවුලට කතා කිරීමට හැකියාවක් ද නැත. ප්‍රියංග ගේ හැසිරීම මාර්ගගත ජාවාරම් යටතට ගැනේ.

## මාර්ගගතව ළමුන් ලිංගික අපයෝජනයට ලක්කිරීම

මාර්ගගත ගිණුමක් හෝ වේදිකාවක් මඟින් ළමා අපයෝජනය සඳහා අවකාශය ලබා දීම මින් අදහස් කෙරේ.

2024 අංක 09 දරණ මාර්ගගත සුරක්ෂිතතා පනතේ 52 වන වගන්තිය යටතේ, මාර්ගගත අවකාශය ඔස්සේ ළමා අපයෝජන වැරදි සිදුකිරීම නීති විරෝධීවන අතර, නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදකි. අපයෝජනය හෝ කාමෝද්දීපන ක්‍රියා හැඟවෙන දරුවන් ඇතුළත් ඡායාරූප, හඬපට, හෝ වීඩියෝපට මාර්ගගත අවකාශයේ හුවමාරු කිරීම මීට ඇතුළත් ය.

උදාහරණයක්: මහින්ද සිය මිතුරන් වන කමල් හා පියල් සමඟ වට්ස්ඇප් ගෲප් එකක් පවත්වාගෙන යන අතර, මෙම ගෲප් එකේ කාමොද්දීපන රූප හුවමාරු වේ. මහින්ද තම අසල්වැසියාගේ 10 හැවිරිදි දියණිය ඇඳුම් මාරුකරන අයුරු දැක්වෙන ඡායාරූපයක් ගෙන එය එම ගෲප් එකට එවයි. මෙය ළමා කාමෝද්දීපන රූප මාධ්‍යයක් වන අතර, මහින්දගේ හැසිරීම මාර්ගගතව ළමුන් ලිංගික අපයෝජනයට ලක්කිරීම යටතට ගැනේ.

## අනවසරයෙන් තොරතුරු මුද්‍රාහැරීම (ඩොක්සිං)

යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුගේ නිවසේ ලිපිනය, දුරකතන අංකය, හෝ එම තැනැත්තා ගිය පාසල වැනි පෞද්ගලික තොරතුරු එම තැනැත්තාගේ අවසරයෙන් තොරව මුද්‍රා හැරීම මින් අදහස් කෙරේ. මෙය බොහෝ විට සිදුකරන්නේ පුද්ගලයකු අපහසුතාවයට පත් කිරීමට, බියවැද්දීමට, හෝ එම පුද්ගලයාට හානි පැමිණවීමට ය.

2024 අංක 09 දරණ මාර්ගගත සුරක්ෂිතතා පනතේ 20 වන වගන්තිය යටතේ, යම් තැනැත්තකුගේ පෞද්ගලික තොරතුරු එම තැනැත්තාට ලැජ්ජා කිරීම, අනාරක්ෂිත බවක් ඇතිකිරීම, හෝ එම තැනැත්තා බියවැද්දීමේ අරමුණින් මාර්ගගතව හුවමාරු කිරීම නීති විරෝධී ක්‍රියාවකි. පෞද්ගලික තොරතුරු අතරට නිවසේ ලිපිනය, දුරකතන අංකය, ඡායාරූප හෝ වීඩියෝපට, සහ යම් තැනැත්තකුගේ පවුලේ හෝ හිතමිත්‍රයන්ගේ පෞද්ගලික තොරතුරු ඇතුළත් ය. මෙම තොරතුරු හුවමාරු කිරීමෙන් එම තැනැත්තා කලබල වන්නේ නම්, නින්දාවට පත්වන්නේ නම්, හෝ එම තැනැත්තාට තර්ජනයක් හෝ කම්පනයක් ඇතිවන්නේ නම්, එය කෙණහිලිකමක් ලෙස සැලකිය හැකි ය.

මාර්ගගතව අඩත්තේට්ටම් හෝ කෙණහිලිකම්වලට ලක්වූ පුද්ගලයන්ට මෙම නීතියෙන් උපකාර ලබාගත හැකි ය. උදාහරණයක් ලෙස, ප්‍රේම සම්බන්ධයක් නැවතීමෙන් හෝ බහින්බස් වීමකින් පසු යම් තැනැත්තකු ඔබගේ පෞද්ගලික තොරතුරු මුද්‍රා හරින්නේ නම් මෙම නීතිය භාවිතාකළ හැකිවනු ඇත.

උදාහරණයක්: රමණි ශ්‍රී ලංකාවේ ජනප්‍රිය රංගන ශිල්පිනියකි. ඈ ඇගේ පෙම්වතා වන නිමල් සමග තිබූ සම්බන්ධය නතර කරයි. ඈට කෙණහිලිකම් කිරීමට නිමල් ඇගේ නිවසේ ලිපිනය ඔහුගේ ෆේස්බුක් ගිණුමේ සටහන් කරයි. නිමල්ගේ හැසිරීම ඩොක්සිං යටතට ගැනේ.



## සයිබර් අපරාධවලින් ජනතාව ආරක්ෂා කිරීමට නීති තිබෙනවා ද?

ඔව්, සයිබර් අපරාධවලින් ජනතාව ආරක්ෂා කිරීමට නීති බොහොමයක් තිබේ.

මේ අතර, දණ්ඩ නීති සංග්‍රහය, 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත, 1947 අංක 04 දරණ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත, 2024 අංක 09 දරණ මාර්ගගත සුරක්ෂිතතා පනත, සහ 2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත පවතී.

## සයිබර් අපරාධ වාර්තාකරන ආකාරය

මාර්ගගත අවකාශය තුළ ඉලක්ක වූ යම් පුද්ගලයකු පිළිබඳ ඔබ දන්නේ නම්, කඩිනම් සහාය ලබා ගැනීම සඳහා ඔබට අනුගමනයකළ හැකි පියවරයන් කිහිපයක් පහත දැක්වේ:

- සිදුවීම වාර්තා කිරීමට පෙර, සාක්ෂි ලෙස එහි ස්ක්‍රීන්ෂොට් ලබා ගන්න.
- අදාළ පෝස්ටුව පළවූ සමාජ මාධ්‍යය තුළ එම පෝස්ටුව රිපෝට් කරන්න.
- ඔබට ළගම පොලිස් ස්ථානයේ හෝ කොළඹ ග්‍රෑන්ඩ් පාස් හි පිහිටි කාන්තා හා ළමා කාර්යාංශයේ පැමිණිල්ලක් ගොනු කරන්න. මෙවන් සිදුවීම්වල දී අවශ්‍ය විශේෂඥ සහාය
- සහ මඟපෙන්වීම ඔවුනට ලබාදිය හැකි ය.සාක්ෂි ලෙස ඔබ ලබාගත් ස්ක්‍රීන්ෂොට්වල මුද්‍රිත පිටපත් ලබාගෙන පොලීසියට ලබා දෙන්න.
- මෙම ක්‍රියාවලිය තුළ ඔබට මඟපෙන්විය හැකි නීතිඥවරයකු හෝ වැඩිහිටියකුට කතා කරන්න.

## මාර්ගගත අවකාශය තුළ ආරක්ෂාව ලබාගත හැකි ආකාරය

- ඔබ ඉන්ස්ටග්‍රෑම්, ෆේස්බුක්, වට්ස්ඇප්, ටික්ටොක්, හෝ ස්නැප්චැට් වැනි සමාජ මාධ්‍ය භාවිතා කරන්නේ නම්, ඔබගේ 'ප්‍රයිවසි සෙටිංග්ස්' වෙනස්කර ඔබ සමඟ සම්බන්ධවිය හැකි පිරිස සීමා කරන්න. ඔබට අවශ්‍ය ඔබගේ පෝස්ටු සහ තොරතුරු ඔබ දැන හඳුනන විශ්වාසවන්ත පුද්ගලයන් පමණක් දැකීම නම්, ඔබගේ ගිණුම 'ප්‍රයිවට්' දමා ගන්න.
- ලිපිනය හෝ දුරකතන අංකය වැනි පෞද්ගලික තොරතුරු කිසිවිටක පොදු ගිණුම්වල සඳහන් නොකළ යුතු ය.
- නාඳුනන පුද්ගයන්ගෙන් ලැබෙන 'ෆ්‍රෙන්ඩ් රික්වෙස්ට්ස්' හෝ පෞද්ගලික පණිවිඩවලට ප්‍රතිචාර දැක්වීමේදී ප්‍රවේශම් වන්න. නාඳුනන පුද්ගලයන් ගණන් නොගෙන සිටීම හෝ 'බ්ලොක්' කර දැමීම ඉතාම සුදුසු ය.
- මාර්ගගත අවකාශයේ යමක් පළකිරීමට පෙර, ඉන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක පිළිබඳව හොඳින් සිතා බලන්න. මන්ද, යමක් එක්වරක් පළකළහොත්, පසුව එය මකාදැමුව ද වෙනත් අයකුට සොයාගත හැකි ය.
- ඔබගේ කීර්තියට හානි ඇතිවිය හැකි හෝ ඔබගේ ආරක්ෂාවට තර්ජනයක්විය හැකි කිසිවක් හුවමාරු කිරීමෙන් වැළකී සිටින්න.
- මාර්ගගත ගිණුම් සඳහා ශක්තිමත්, ඔබටම ආවේණික වූ මුරපදයක් යොදන්න. එය වෙනත් කිසිවකු සමඟ හුවමාරුකර නොගන්න. යහළුවකු සමඟවත් හුවමාරුකර නොගන්න. මෙම මුරපදය කාලයෙන් කාලයට වෙනස් කිරීම ද ආරක්ෂාව තවත් ශක්තිමත් කරයි.
- ඔබගේ ජංගම දුරකතනයේ පවතින ඇප්වලට එන 'ලොකේෂන්' සේවාවන් ක්‍රියා විරහිත කරන්න. එවිට එම ඇප්වලට ඔබගේ අනුදැනුමකින් තොරව ඔබ සිටින්නේ කොහේද යන්න සොයාගත නොහැකිවනු ඇත.

## නිරුවත් ඡායාරූප හුවමාරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ ගතහැකි නීතිමය ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකාව තුළ, නිරුවත් ඡායාරූප යැවීම, බෙදාහැරීම, සහ ළඟ තබාගැනීම සිදුවන්නේ නම්, එය කවුරුන් විසින් කා හට යැව්ව ද, එය සිදුවන දෙපාර්ශවය අතර සම්බන්ධතාවය කුමක් වූව ද, එය අසභ්‍ය ප්‍රකාශන පනතේ 02 වන වගන්තිය යටතේ වරදක් සේ සැලකේ.

**නිරුවත් ඡායාරූප යැවීම, ලබා ගැනීම හෝ ළඟ තබාගැනීම නීති විරෝධී ක්‍රියාවක් බව සිහියේ තබා ගැනීම වැදගත් ය. එසේ සිදුවන්නේ දෙපාර්ශවයේ කැමැත්ත මත වූව ද එය වරදකි.**

මේ අනුව, ගැහැණු ළමයෙකු සිය කැමැත්තෙන් ම තම පෙම්වතා ට ඇගේ නිරුවත් ඡායාරූපයක් යැව්වේ නම්, එම අපරාධයට ඇ ද වැරදිකාරියක වනු ඇත. මෙසේ ඡායාරූපයක් යවන ලද්දේ ඇට බලකර සිටීම හෝ ඇ අවමාන තර්ජනයකට ලක්වීම මත නම් ඇ වැරදිකාරියක නොවනු ඇත.

ඔබ ඔබගේ නිරුවත් ඡායාරූපයක් යම් තැනැත්තකුට යැව්වේ නම්, එම තැනැත්තාට ඔබට විරුද්ධව අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත යටතේ පැමිණිලිකළ හැකි ය. භාවිතය අනුව, මෙය සිදුවන්නේ කලාතුරකිනි. ඔබගේ නිරුවත් ඡායාරූපයක් වෙනත් තැනැත්තකු විසින් හුවමාරුකර ඇත්තේ නම්, තවදුරටත් එවන් හුවමාරුවීම් වැළැක්වීම සඳහා පොලීසියට පැමිණිල්ලක් ගොනුකිරීම සුදුසු ය.

# පොලීසිය සමඟ වැඩ කිරීම

පොලිස් ස්ථානයකට ඇතුළුවීම බියජනක විය හැකියි, අපරාධයක වින්දිතයකු වීම පීඩාකාරී මෙන්ම අපහසුවිය හැකියි. පහත දැක්වෙන්නේ පොලිස් ස්ථානයක් තුළ පුද්ගලයකුට හිමිවිය යුතු අයිතිවාසිකම් පිළිබඳ සරල පැහැදිලි කිරීමකි.



## පොලිස් ස්ථානයක පැමිණිල්ලක් ගොනුකරන ආකාරය

ළඟම පොලිස් ස්ථානය වෙත යන්න, ඔබ දරුවකු නම් වැඩිහිටියකු සමඟ යන්න.

හැකිනම් නීතිඥවරයකු ළඟ තබාගන්න. ඔබගේ ප්‍රකාශය නිවැරදිබව තහවුරු කිරීමට, හා සමස්ත ක්‍රියාදාමය තුළ ඔබට සාධාරණ අන්දමින් සැලකිලි හා උපකාර ලැබෙන බව සහතික කිරීමට නීතිඥවරයකුට හැකි ය.

කාන්තා හා ළමා කටයුතු අංශයට කතා කිරීමට අවශ්‍ය බව පවසන්න. ඔවුනට සමස්ත සිදුවීම ම පැහැදිලි කිරීමට සූදානම් වී සිටින්න. අවශ්‍ය නම් පොලිස් ස්ථානයට යාමට පෙර සිදුවීම කොළයක ලියා තබා ගැනීම සුදුසු ය.

ඔබ අපහසුතාවයට පත්ව සිටී නම්, පොඩි විරාමයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටින්න.

කටඋත්තරයක් ලබාදෙන විට, සෑමදෙයක් ම නිවැරදිව පැහැදිලි කිරීම වැදගත් ය. හැකි නම්, අත්සන් කිරීමට පෙර ඔබගේ කටඋත්තරය නිවැරදි දැයි පරීක්ෂාකර දෙන මෙන් නීතිඥවරයාගෙන් ඉල්ලා සිටින්න.

ප්‍රකාශයේ කුවිතාන්සියක් ලබා දෙන මෙන් පොලීසියෙන් ඉල්ලා සිටින්න. මෙය ඉතා වැදගත් බැවින් එම කුවිතාන්සිය අහිමි කර නොගන්න.
මෙම කුවිතාන්සිය හඳුන්වනු ලබන්නේ "1/බී පෝරමය" යනුවෙනි. ඇතැම්විට, පෝරමය පිරවීම සඳහා අවශ්‍ය කඩදාසි නැති බව පොලීස් ස්ථානය විසින් පැවසීමට ඉඩ ඇත.
තත්ත්වය කුමක් වුවත්, ඔබගේ පැමිණිල්ල හෝ කටඋත්තරයට අදාළ කුවිතාන්සියක් අනිවාර්යයෙන් ඔබට ලබාදිය යුතු ය.

ඔවුන් විසින් නිකුත්කරනු ලබන කුවිතාන්සියේ පහත තොරතුරු තිබේ දැයි පරීක්ෂාකර බලන්න:

- පොලිස් ස්ථානයේ නම
- දිනය
- පැමිණිලිකරුගේ නම
- පැමිණිල්ලේ ස්වභාවය
- තොරතුරු පොතේ යොමුව
- සටහන්කර ගන්නා නිලධාරියාගේ නම, නිලතලය හා ලාංඡන අංකය
-

මීළඟට සිදුවීමට නියමිත කුමක්ද යන්න හා ඉදිරි තොරතුරු ලබාගත හැක්කේ කෙසේද යන්න ඔවුන්ගෙන් විමසන්න. ඔබගෙන් ප්‍රශ්නකළ නිලධාරියාගේ නම හා දුරකතන අංකය ලබාගන්න.

### මතකයේ තබාගත යුතු වැදගත් කරුණු

- ඔබගේ පැමිණිල්ලේ ප්‍රතිඵලය ඔබ අපේක්ෂා කරන්නේ කුමන ආකාරයට ද යන්න මෙන්ම ඔබගේ පැමිණිල්ල බැරෑරුම් ව සැලකිල්ලට ගන්නා මෙන් ඔවුනට පැවසීමට ඔබට අයිතියක් ඇත.
- පොලිස් නිලධාරියා සමග පෞද්ගලිකව කතාකිරීමට ඔබට අවසර ඉල්ලා සිටිය හැකිය.
- ඔබට උපකාරකළ හැකි සංවිධාන හෝ පුද්ගලයන් පිළිබඳ තොරතුරු ඔබට විමසිය හැකි ය. ඔබට එරෙහිව සිදුවන වෙනත් අපරාධ වැළැක්වීම සඳහා අපරාධකරුගෙන් ඔබව ආරක්ෂාකර ගැනීමට ඔවුන් වගබලා ගත යුතුය.

### පොලීසිය විසින් නිසි ක්‍රමවේදයන් අනුගමනය නොකරන බව ඔබට හැඟී යන්නේ නම්:

- **ලිඛිත පැමිණිල්ලක් ගොනුකරන්න:** පොලිස් කොමිෂන් සභාවට හා පොලිස්පතිවරයාට ලිපියක් යොමුකරන්න, මෙම ලිපියේ පිටපතක් අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට ද යොමුකරන්න.
- **මානව හිමිකම් කොමිෂන් සභාව හා සම්බන්ධ වන්න:** සාධාරණ නෛතික ක්‍රමවේදයක් සඳහා සෑම අයෙකුට ම අයිතියක් පවතියි. ඔබගේ අයිතිවාසිකම් සුරක්ෂිත වී ඇති බව තහවුරු කිරීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාවට උපකාරකළ හැකි ය.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනුකරන්නේ කෙසේ ද?

සිංහල, ඉංග්‍රීසි සහ දමිළ භාෂාවලින් පැමිණිලි ගොනුකළ හැකි ය.

### ක්ෂණික ඇමතුම් සේවාවෙන් පැමිණිලි ගොනු කිරීම

- ඔවුන්ගේ ක්ෂණික ඇමතුම් සේවාවන් සඳහා 1996, හෝ 0112 505 575 ඇමතිය හැකි ය.
- පොලීසියේ දී ලබාදෙන ආකාරයට, අදාළ සියලු තොරතුරු නිවැරදිව ඔවුන් වෙත ලබා දෙන්න.
- පැමිණිල්ලට අදාළව යොමු අංකයක් ඉල්ලා සිටින්න, එමෙන්ම සටහන්කර ගන්නා නිලධාරියාගේ නම අසා දැනගන්න, එවිට ඉදිරියට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳ ඔබට අවබෝධයක් ලබාගත හැකි ය.

### පැමිණිලි පෝරමයක් පිරවීම

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ *වෙබ්අඩවියේ* (https://www.hrcsl.lk/make-a-complaint/) 'පැමිණිලි කරන්න' යනුවෙන් සඳහන් ටැබ් එකෙන් ඔබ කැමති භාෂාවෙන් පැමිණිලි පෝරමයක් බාගෙන මුද්‍රණය කරගන්න.
- කොළඹ 04 හි පිහිටි මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාලයෙන් ද ඔබට පැමිණිලි පෝරමයක් ලබාගත හැකි ය.
- ඔබගේ පැමිණිලි පෝරමය පෞද්ගලිකව හමු වී භාරදිය හැකි අතර, sechrcsl@gmail.com යන ඊමේල් ලිපිනයට යොමුකිරීමට ද හැකි ය.

# ඔබගේ අයිතීන් ගැන දැනුවත් වෙන්න

## වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

**ශ්‍රී ලංකාව තුළ, හානිවලට ලක්වූ පුද්ගලයන් (වින්දිතයන්) හෝ මිනිසුන් පීඩාවට පත්කරන සිදුවීම් ඇසින් දුටු පුද්ගලයන් (සාක්ෂිකරුවන්) ආරක්ෂා කිරීම සඳහා, 2023 අංක 10 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත (2015 අංක 04 දරණ පනතින් පසු නැවත බලාත්මකකර ඇත) වැනි විශේෂ නීති පවතී. මෙම පනත යටතේ, වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය සහ පොලිස් අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහාය සහ ආරක්ෂණ අංශය පිහිටුවා ඇත. මෙම අංශ පිහිටුවා ඇත්තේ ජාත්‍යන්තර සම්මතයන් හා හොඳම භාවිතයන්වලට අනුකූලව ය.**

## වින්දිතයන්ගේ ප්‍රධාන අයිතීන්

- **සාධාරණ සැලකීම:** සමාන හා සාධාරණ සැලකීම් ලැබීමට වින්දියන්ට අයිතිය ඇත. ඔබට සිදු වූ දෙය මත කිසිවකුට ඔබට නරක අන්දමින් සැලකිය නොහැක.
- **ගරුත්වය හා පෞද්ගලිකත්වයට ගරු කිරීම:** හැඟීම් සහ පෞද්ගලිකත්වය වැදගත් ය. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් වින්දිතයන්ගේ හැඟීම්වලට ගරුකළ යුතු අතර, ඔවුන්ගේ පෞද්ගලිකත්වයට අත නොදැමිය යුතු ය.
- **වැඩිදුර හානිවලින් ආරක්ෂාව:** ඔබ මුහුණදුන් අත්දැකීමේ ප්‍රතිවිපාකයක් ලෙස ඔබව බියවැද්දීමට ඔබට තර්ජනය කිරීමට කිසිවකුට හැකියාවක් නැත. එවන් ක්‍රියාවන්වලින් ආරක්ෂාව ලැබීමට ඔබට අයිතිය ඇත.
- **වෛද්‍ය උපකාර:** යම් සිදුවීමක් නිසා ඔබ ශාරීරිකව තුවාල ලබා ඇතිනම් හෝ මානසිකව පීඩාවට පත්ව සිටී නම්, ඔබ වෛද්‍ය වෘත්තිකයකුගේ උපකාර ලබාගැනීමට කටයුතුකළ යුතුය, නැතහොත් ඔබ රැකබලා ගෙන උපකාර කිරීමට හැකි පුද්ගලයකු වෙත යොමුවිය යුතු ය.
- **උපකාර ලබාගැනීම:** ඔබ මුහුණදුන් අත්දැකීම ගැන පොලිස් නිලධාරීන් වැනි බලධාරියකු කෙරේ විශ්වාසය තබා පැවසීම සුදුසු ය. ඔබගේ පැමිණිලි බැරෑරුම් ලෙස සලකා බලා ඒ සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් දියත් කිරීමට බලධාරීන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය ය.
- **නීතිඥවරයකු ලබා ගැනීම:** ඔබට යම් තැනැත්තකු විසින් හානි සිදුකළේ නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් දියත් වෙමින් පවතී නම්, නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම සඳහා ඔබට අයිතිය ඇත. ඔබ වෙනුවෙන් නීතිමය නියෝජනයක් සිටීම, ඔබගේ සාක්ෂිවල වලංගුභාවය සහතික කිරීමට මෙන්ම නඩු කටයුතු නිසි පරිදි අවබෝධකර ගැනීමට ඔබට දායකවනු ඇත.

## සාක්ෂිකරුවන්ගේ ප්‍රධාන අයිතීන්

- සාධාරණ සැලකීම්: ඔබ ඇසින් දුටුවේ මොනවාද යන්න ඔබෙන් අසන විට, බලධාරීන් විසින් ඔබට ගෞරවයෙන් යුතු ව සැලකිය යුතු ය. පැමිණිල්ලක් හෝ කටඋත්තරයක් ලබාදෙන ඕනෑම පුද්ගලයකුට සමාන ව සැලකිය යුතු ය.
- කෙණහිලිකම් හෝ බියවැද්දීම්වලට ලක්නොවිය යුතුයි: ඔබ හෙළිදරව් කිරීමට අකමැති යම් තොරතුරක් වේ නම්, එය හෙළිදරව් කරන මෙන් ඉල්ලා ඔබට බල කිරීමට හෝ ඔබව බියවැද්දීමට කිසිවකුට හැකියාවක් නැත.
- හානිවලින් ආරක්ෂාව: ඇසින් දුටු යමක් හෙළිදරව් කිරීම නිසා යම් ජීවිත තර්ජනයක් පැමිණීමේ අවදානමක් තිබේ නම්, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මකවිය යුතු ය. ඔබ බලධාරීන්ට කතාකළ ද, අධිකරණය හමුවේ පෙනී සිටිය ද, නැතහොත් වෙනත් ක්‍රමයක් මඟින් සාක්ෂි ලබා දුන්න ද, ඊට එල්ලවිය හැකි ප්‍රතිප්‍රහාරවලට ඔබ බිය නොවිය යුතු ය.

මෙම අයිතිවාසිකම් පවතින්නේ, යම් තත්ත්වයක් නිවැරදි කිරීම සඳහා බියෙන් හෝ නරක සැලකිලිවලින් තොරව දායක වීමට ඔබට ඇති හැකියාව සහතික කිරීම සඳහා ය. ඔබගේ සහාය නිසා යම් අයෙකු ඔබව අපහසුතාවයට පත් කිරීමට හෝ බිය වැද්දීමට උත්සාහ කරන්නේ නම්, විශ්වාසවන්ත පුද්ගලයකු හෝ සංවිධානයකට ඒ බව පැවසීම ඉතා වැදගත් ය. ඔබගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම සඳහා ඔවුනට සහාය ලබාදිය හැකි ය.

ආරක්ෂාකාරී ව පැමිණිල්ලේ කටයුතු ඉදිරියට පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වැඩිදුර උපකාර සඳහා නීතීඥවරයකුගේ සහාය ලබා ගන්න.

# අධිකරණයට යාම

ඔබගේ නඩුව අධිකරණයට ඉදිරිපත් වුවහොත්, ඔබ සාක්ෂිකරුවකු සහ / හෝ වින්දිතයකු ලෙස අධිකරණ කටයුතුවලට ඉදිරිපත් කෙරෙනු ඇත.

නඩුකරයේ පළමු දින කිහිපය තුළ හා ඉන් අනතුරුව ඔබව කැඳවන දිනයන්වල ඔබ අධිකරණයට පැමිණ සාක්ෂි ලබාදිය යුතු ය. ඔබගේ නඩුව නිසි පරිදි අවසන්වන බව සහතික කිරීම සඳහා ඔබගේ නීතීඥවරයා අධිකරණයට පැමිණෙනු ඇත.

සාක්ෂි ලබාදීම සඳහා ඔබව කැඳවූයේ නම්:

- සිදුවීම සහ මුහුණදුන් අත්දැකීම් නිසි පරිදි පැහැදිලි කිරීමට සූදානම් ව පැමිණෙන්න. ඔබගේ නඩුව අවසානවන තුරු අවශ්‍ය සියලු කරුණු මතකයේ තබා ගැනීමට උපකාරවන සවිස්තරාත්මක සටහනක් සාදා ගන්න. සාක්ෂි ලබාදීමට පෙර මෙම සටහන් හොඳින් කියවා මතකයේ තබා ගන්න.
- හරස්-ප්‍රශ්න අසන විට, විත්තියේ පාර්ශවය විසින් ඔබව බියවැද්දීමට උත්සාහ කරනු ඇත. ඔබගේ සාක්ෂියේ නිරවද්‍යතාවයට හා පෙළගැස්මට ඉන් බලපෑම් ඇතිවීමට ඉඩ ලබා නොදෙන්න.
- සෙමින් කතා කරන්න, කරුණු නිවැරදි ව මතක්කර ගැනීම සඳහා කල්පනා කිරීමට කාලය ගන්න.

ඔබ අධිකරණයට එන විට හැඳිය යුත්තේ කුමක්ද යන්න පිළිබඳ අදහසක් නැතිනම්, ඒ ගැන ඔබගේ නීතීඥවරයා සමඟ සාකච්ඡා කරන්න.

# සේවාවන්

**නීතිමය සහාය සහ ආරක්ෂාව**

- අයිප්‍රෝබෝනෝ (නොමිලේ නීතිමය සහාය හා නියෝජනය) - 0701 706 200
- පොලිස් හදිසි ඇමතුම් - 119
- පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය - 0112 444 444 or 109 (ක්ෂණික ඇමතුම්)
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය - 1929
- කාන්තාවන්ගේ උපකාරක සේවය - 1938
- හෝම් ෆෝ හියුමන් රයිට්ස් - 0112 577 962
- පොලිස්පති වෙත පැමිණිලි යොමු කිරීම සඳහා - https://telligp.police.lk/ / 118

---

**මනෝවිද්‍යා සහාය**

- ඉමර්ජ් මනෝවිද්‍යා සේවය - 0776 744 111
- ශාන්ති මාරගම් - 0717 639 898
- ජාතික මානසික සෞඛ්‍ය උපකාරක සේවය - 1926
- කාන්තාවන්ගේ උපකාරක සේවය - 1938
- වෛද්‍ය දර්ශනී හෙට්ටිආරච්චි - රිජ්වේ ආර්යා ළමා රෝහල
- වෛද්‍ය අනුරාධ හේරත් - කලුබෝවිල ශික්ෂණ රෝහල
- ලීඩ්ස් චයිල්ඩ් කෙයාර් ක්ෂණික ඇමතුම් - 0757 121 212

---

**සහාය සඳහා වෙනත් සම්පත්**

- ඉමර්ජ් ලංකා පදනම - 0770 819 133 / 0714 683 151
- ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමය 0112 555 455

---

**හදිසි සහාය**

- චයිල්ඩ් ප්‍රොටෙක්ෂන් ෆෝර්ස් 0114 848 856
- විමෙන් ඉන් නීඩ් 0775 676 555
- සම්බෝල් පදනම 0776 772 848



## අපව අමතන්න

**Email/**

contact@i-probono.com

**Website/**

www.i-probono.com

/@iprobono /@iProbono /@iProbono